# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2018

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

**උසස් අධ්‍යාපන**

நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சு

**உயர் கல்வி**

Ministry of City Planning, Water Supply & Higher Education

**Higher Education**

# වාර්ෂික වාර්තාව
# 2018

උසස් අධ්‍යාපන

## දැක්ම

ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය පිළිබඳ
විශිෂ්ටතම ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට
පත් කිරීම

## මෙහෙවර

ප්‍රතිඵල අරමුණු කොටගත්
ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සකස් කිරීම සහ
ක්‍රියාත්මක කිරීම තුළින්
ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පද්ධතියේ ශිෂ්‍යයන් සහ
අනෙකුත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම

## අරමුණු

- උසස් අධ්‍යාපනය වෙත ප්‍රමාණවත් ප්‍රවේශ අවස්ථා සැලසීම
- ගුණාත්මය සහ අදාළත්වය ඉහළ නැංවීම
- පර්යේෂණ ප්‍රතිඵල සහ නවෝත්පාදනය තුළින් ජාතික ආර්ථිකය සඳහා දායක වීම
- තොරතුරු තාක්ෂණය පදනම් කොටගත් කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම



# ලේකම්තුමාගේ පණිවුඩය

උසස් අධ්‍යාපනය වූ කලී රටක අනාගතයේ හැඩය තීරණය කරන බලවත් ම මෙවලමකි. ශ්‍රී ලංකාව වැනි සාක්ෂරතාවය ඉතා ඉහළ මට්ටමක පවතින රටක උසස් අධ්‍යාපනයේ උපයෝගීතාව ඉහළ ම මට්ටමක පවතී.

රටේ සමාජ ආර්ථික සංවර්ධන ඉලක්ක ජය ගැනීම උදෙසා මානව සම්පත් සංවර්ධනය ඉතාමත් ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා කරනු ලබන සමස්ථ රාජ්‍ය ආයෝජනය පසුගිය වසර කීපය තුල සීඝ්‍ර වශයෙන් වැඩි කොට ඇත. කෙසේ වුවද අ.පො.ස උසස් පෙල සමත් දරුවන්ගෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුල අධ්‍යාපනය ලැබීමට සිදුවන්නේ සීමිත පිරිසකට වීම නිසා උසස් අධ්‍යාපන අවශ්‍යතා, වෘත්තීය පුහුණු හා තෘතීය අධ්‍යාපන අවශ්‍යතා පුළුල් කිරීමට ද රජය ක්‍රියාකර ඇත.

මෙරට සරසවි තුළින් බිහිවන උපාධිධරයා ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කළ හැකි, ජාත්‍යන්තරය සමඟ කරට කර තරඟ කරන්නට හැකි වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම විශ්වීය දැනුමක් විශ්වවිද්‍යාලය තුළින් ලබා ගන්නා විද්වතකු කරන්නට ත් ඒ සමඟ ම ඔහු හෝ ඇය මනුෂ්‍යත්වය වෙනුවෙන් පෙනී සිටින්නකු බවට පත් කිරීමටත් අවැසි පියවර එකින් එක ගනිමින් සිටිමු.

නිදහසින් වසර 70ක් ගෙවී ගියද අප මුහුණ දී ඇති සමාජ ආර්ථික ප්‍රශ්න පිලිබඳව සාර්ථක විසඳුම් සොයා ගැනීමට අප අපොහොසත් වී ඇති බැවින් එකී අභියෝගයන් ජයගත හැකි ගුණාංග සපිරි විද්‍යාර්ථීන් බිහිකර ගනු ලැබීමට උසස් අධ්‍යාපනයේ මංපෙත් පුළුල් විය යුතු බැව් අප විශ්වාස කරමු.

ප්‍රියන්ත මායාදුන්නේ,
ලේකම්,
නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

# පටුන

1. උසස් අධ්‍යාපන අංශය පිළිබඳ හැඳින්වීම ........ 01

1.1 උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යූහය ........ 01

1.2 උසස් අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරී අංශ........ 01

1.3 උසස් අධ්‍යාපන අංශයේ කාර්යය මණ්ඩලය-2018.12.31 දිනට ........02-03

2. ආංශික කාර්යය සාධනය ........04-48

2.1 පාලන අංශය ........04-11

2.2 ගිණුම් අංශය........11-14

2.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය........15-18

2.4 ප්‍රසම්පාදන අංශය........19-20

2.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය........21-26

2.6 සංවර්ධන අංශය........26-34

2.7 සැලසුම් අංශය ........34-38

2.8 අභ්‍යන්තර විගණන අංශය ........39-41

2.9 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ........41-48

3. සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය 2018........49-60

3.1 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 2018 ........60-62

4. විදේශීය ප්‍රධාන යටතේ ප්‍රතිපාදන වෙන් කල පර්යේෂණ ව්‍යාපෘති වල ප්‍රගතිය ........63-69

## 1. උසස් අධ්‍යාපන අංශය පිලිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට  දායක විමට මෙන්ම ජාත්‍යන්තර රැකියා වෙළඳ පොලට ප්‍රවේශ වීමට අවස්ථාවන් ලබා ගැනීමේ ප්‍රධාන අරමුණින් උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවන් සොයා යන්නන් සඳහා උසස් අධ්‍යාපනය ලබා දීමේ ප්‍රධාන වගකිම උසස් අධ්‍යාපන අමාත්‍යංශය සතු වේ. එම අරමුණ මුදුන්පත් කර ගැනිමේදී උසස් අධ්‍යාපනය සඳහා ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීමේ සිට රාජ්‍ය විශ්වවිද්‍යාල තුල නව පීඨ සහ අංශයන් ස්ථාපිත කිරිම තුලින් අධ්‍යයන අවස්ථා ඉහළ නැංවීම මෙන්ම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධතිය නියාමනය කිරීම දක්වා වූ කර්තව්‍යයන් රැසක් අමාත්‍යංශය හරහා සිදු වේ. එමෙන්ම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම, උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවිම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිකිරීම, පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී අංශ සඳහා දායකවීම දක්වා අමාත්‍යංශයේ කාර්යභාරය විහිදී යයි.

### 1.1 උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන ව්‍යුහය පිළිබඳව සලකා බැලීමේ දී, අමාත්‍යංශය යටතේ ඇති ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඍජු අධීක්ෂණය යටතේ විශ්වවිද්‍යාල 15ක්, (සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල 14ක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්විද්‍යාලය මීට අයත් වේ) උසස් අධ්‍යාපන ආයතන 10ක් සහ පශ්චාත් උපාධි ආයතන 08ක් පවතී. එසේම අමාත්‍යංශයේ ඍජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) අමාත්‍යංශය යටතේ පවතින අතර ඒ යටතේ ආයතන 19ක් ක්‍රියාත්මක වේ.මෙම ආයතන 19න් 11ක් උසස් තාක්ෂණ ආයතන (ATI) වන අතර අනෙකුත් ආයතන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අංශ ලෙස සැලකේ.

### 1.2 උසස් අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරී අංශ

- පාලන අංශය
- ගිණුම් අංශය
- යටිතල පහසුකම් සංවර්ධන අංශය
- ප්‍රසම්පාදන අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය
- සංවර්ධන අංශය
- සැලසුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

## 1.3 උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය - 2018.12.31 දිනට

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | 1 | 1 | 0 |
| | | අතිරේකලේකම් (පාලන හා මුදල්) | 1 | 1 | 0 |
| | | අතිරේක ලේකම් (සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 1 | 1 | 0 |
| | | අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) | 1 | 1 | 0 |
| | | ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 1 | 0 |
| | | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය අංශය) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 1 | 0 |
| | | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 0 | 1 |
| | | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| | | ඉංජිනේරු (සිවිල්) | 1 | 1 | 0 |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව / කුසලතා සංවර්ධන ) | 2 | 1 | 1 |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) | 1 | 1 | 0 |
| | | නි.අධ්‍යක්ෂ/ස. අධ්‍යක්ෂ (සැලසුම්) | 2 | 2 | 0 |
| | | සහකාර අධ්‍යක්ෂ ( ශිෂ්‍ය ණය අංශය ) | 1 | 0 | 1 |
| | | සහකාර අධ්‍යක්ෂ ( ශිෂ්‍ය ණය අංශය ) | 1 | 1 | 0 |
| | | නීති නිලධාරී | 1 | 1 | 1 |
| | | ගණකාධිකාරී | 1 | 1 | 0 |
| | | සහකාර ලේකම් | 2 | 0 | 2 |


| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (ii) | තෘතියික | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| | | භාෂා පරිවර්තක | 2 | 1 | 1 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 | 0 | 1 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී ( ශිෂ්‍ය ණය අංශය ) | 2 | 0 | 2 |
| (iii) | ද්විතියික | සංවර්ධන නිලධාරි | 80 | 40 | 40 |
| | | සංවර්ධන සහකාර | 9 | 1 | 8 |
| | | සැපයුම් සහකාර | 1 | 1 | 0 |
| | | ප්‍රවෘත්ති නිලධාරි | 1 | 1 | 0 |
| | | කාර්මික නිලධාරි | 1 | 0 | 1 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 36 | 36 | 0 |
| | | නිශ්චල ඡායාරූප ශිල්පි | 1 | 0 | 1 |
| | | කැමරා ශිල්පි | 1 | 0 | 1 |
| | | පිළිගැනීමේ නිලධාරි | 1 | 0 | 1 |
| | | සංඛ්‍යාලේඛන නිලධාරි | 1 | 1 | 0 |
| (iv) | ප්‍රාථමික | කාර්යාල කාර්ය සහයක | 22 | 10 | 10 |
| | | රියදුරු | 22 | 12 | 07 |
| | | කැමරා ක්‍රියාකරු සහායක | 1 | 1 | 0 |
| එකතුව | | | 210 | 132 | 78 |

# 2. ආංශික කාර්ය සාධනය

## 2.1 පාලන අංශය

උසස් අධ්‍යාපනය නංවාලීම පිණිස නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මගින් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය නංවාලීම සහ පවත්වාගැනීම සඳහා අමාත්‍යාංශයේ අභිමතාර්ථ සහ කාර්යයන් වලට ගැලපෙන උසස් තත්ත්වයක් සහිත ප්‍රශස්ථ සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අඛණ්ඩ සහ ඵලදායී ආකාරයෙන් සේවා සැපයීම, අනෙකුත් ආයතන සමඟ විධිමත් සම්බන්ධිකරණයක් ඇති කිරීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක පහසුකම් නංවාලීම සහ අමාත්‍යාංශයේ සමස්ත පරිපාලනය, මෙහෙයවීම සහ ඇගයීම නංවාලීම පාලන අංශය මගින් සිදු කරනු ලැබේ.

සංවිධාන සටහන



### 2.1.1 පාලන අංශයේ කාර්යභාරය

- දෛනිකව අමාත්‍යාංශය වෙත ලැබෙන හා බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එහි සාධනීය බව සහතික කිරීම.
- අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යවනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා ජනාධිපති කාර්යාලයෙන් හා විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් අදාල පාර්ශව වෙත යැවීම සඳහා පියවර ගැනීම.
- අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.
- අමාත්‍යාංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම සහ රක්ෂණය කිරීම,ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම .
- අමාත්‍යාංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයට සැපයීම, ගොඩනැගිලි,යන්ත්‍ර සූත්‍ර හා නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම
- අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ රාජකාරි දුරකතන බිල්පත් පියවීම
- අමාත්‍යාශ නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශ ගමන් බලපත්‍ර,වීසා,VIP,ගමන් වියදම් හා දීමනා ලබාදීම පිලිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැර යාම සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරු පැදි ණය, උත්සව අත්තිකාරම් ණය ලබා දීම සම්බන්ධ කටයුතු හා අග්‍රහාර රක්ෂණ කටයුතු සිදු කිරීම.
- මාසික දුම්රිය වාර ප්‍රවේශපත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර ( warrants)නිකුත් කිරීම.
- මැතිවරණ පවත්වන අවස්ථාවලදී ඒවාට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- උසස් අධ්‍යාපන අංශයෙහි කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් හා විශ්‍රාම ගැන්වීම්
- උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම් හා සේවය අවසන් කිරීම්
- බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම
- කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුවීමේ අවස්ථා ලබා දීම
- උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතනයන්හි හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු විශ්වවිද්‍යාල ආචාර්යවරු සඳහා සහනදායී මෝටර් බලපත්‍ර නිකුත් කිරීම

- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අනධ්‍යන කාර්ය මණ්ඩල පත් කිරීම හා පුරප්පාඩු පිරවීම
- විශ්වවිද්‍යාල සඳහා විදේශීය ආචාර්යවරුන් කොන්ත්‍රාත්/ තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම
- විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද්විතීයන පදනම මත තාවකාලිකව/ ස්ථිරව මුදා හැරීම
- විශ්වවිද්‍යාල පද්ධතියේ දීමනා සම්බන්ධ මහා භාණ්ඩාගාරය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් විෂමතා පිළිබඳව අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දීම
- විදේශ ආධාර හා ණය මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම හා කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම

### 2.1.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 876 චක්‍රලේඛයට අදාලව විශ්වවිද්‍යාල සහ ආයතනවල තනතුරු පුරප්පාඩු පිරවීම

2018 වර්ෂය තුළදී සියළුම විශ්වවිද්‍යාල සහ ආයතන සඳහා තනතුරු 1,832 ක් අනුමත කර ඇත.

| විශ්වවිද්‍යාලය හෝ ආයතනය | අනුමැතිය ලබා දී ඇති තනතුරු සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 28 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 170 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 85 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 157 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 180 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 170 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 97 |
| රජරට විශ්වවිද්‍යාලය | 13 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 35 |
| යාපනය විශ්වවිද්‍යාලය | 231 |
| වයඹ විශ්වවිද්‍යාලය | 45 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 67 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 66 |
| සෞන්දර්යකලා විශ්වවිද්‍යාලය | 23 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 15 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 21 |
| සෞන්දර්ය අධ්‍යනය පිළිබඳ ස්වාමි විපුලානන්ද විද්‍යාලය | 28 |
| ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය | 01 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 01 |
| මානව සම්පත් අභිවර්ධන ආයතනය | 14 |
| කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය | 07 |
| ජෛව රසායන අනුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය | 13 |
| පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 03 |
| කොළඹ විශ්වවිද්‍යාලය පරිගණක පාසල | 20 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 07 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 25 |

| | |
|---|---:|
| ශ්‍රී ලංකා යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩලය | 33 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය | 02 |
| තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය | 33 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 08 |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | 80 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 129 |
| දේශිය වෛද්‍ය විද්‍යා ආයතනය | 25 |
| එකතුව | 1,832 |

### 2.1.3 දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්

මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් 2018 වර්ෂය තුළදී දේශීය හා විදේශීය පුහුණු සඳහා යොමු කර ඇති අතර අමාත්‍යාංශයේ සියලු නිලධාරීන් සඳහා දේශීය පුහුණු අවස්ථා ලබාදී ඇත.

**දේශීය පුහුණු වැඩසටහන්**

| පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | අමාත්‍යාංශයෙන් දරන ලද වියදම (රු) |
|---|---:|---:|---:|
| දේශීය පුහුණු වැඩසටහන් | 25 | 115 | 1,200,000.00 |

**විදේශීය පුහුණු /සම්මන්ත්‍රණ වැඩසටහන්**

| පුහුණු වැඩසටහන් පවත්වන ලද රට | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් ගණන | අමාත්‍යාංශයෙන් දරන ලද වියදම |
|---|---|---|---:|
| චීනය | 06 | 13 | ඇ. ඩො.6,680<br>ස්ටර්ලින් පවුම් 450 |
| ඉන්දියාව | 02 | 04 | ඇ. ඩො.1,770 |
| මැලේසියාව | 02 | 03 | ඇ. ඩො.1360<br>ස්ටර්ලින් පවුම් 75 |
| කොරියාව | 01 | 01 | ඇ. ඩො.671<br>රු. 6,400 |
| ඔස්ට්‍රියාව | 01 | 02 | ඇ. ඩො.1360<br>ස්ටර්ලින් පවුම් 450 |

### 2.1.4 සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017.06.01 දින නිකුත් කරන ලද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක.01/2016 (II) හා 2018.02.15 දින නිකුත් කරන ලද 01/2018 චක්‍රලේඛය 2018.06.08 දින නිකුත් කරන ලද 01/2018 (I) චක්‍රලේඛ අනුව මෙම අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේදී සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කරන ලදී.ඒ අනුව රාජ්‍ය සේවයේ,මෙම අමාත්‍යාංශය යටතේ පවතින විශ්වවිද්‍යාල,ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා අනෙකුත් උපාධි ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලවල,අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත්

විධායක තනතුරක සේවය කරන සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා ඉහත සඳහන් චක්‍රලේඛ යටතේ 2018 වර්ෂයේදී නිකුත් කරන ලද සහනදායි මෝටර් රථ බලපත්‍ර පහත වගුවේ සඳහන් වේ.

| අනු අංකය | විශ්වවිද්‍යාලය/ආයතනය | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | මුළු ගණන |
|---|---|---|---|---|---|
| 01. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 10 | 238 | 37 | 285 |
| 02. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 5 | 250 | 3 | 258 |
| 03. | කැලණිය විශ්වවිද්‍යාලය | 2 | 232 | 2 | 236 |
| 04. | රුහුණ විශ්වවිද්‍යාලය | 3 | 223 | 8 | 234 |
| 05. | කොළඹ විශ්වවිද්‍යාලය | 7 | 197 | 1 | 205 |
| 06. | යාපනය විශ්වවිද්‍යාලය | 12 | 116 | 5 | 133 |
| 07. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 8 | 77 | 5 | 90 |
| 08. | මොරටුව විශ්වවිද්‍යාලය | 5 | 82 | 3 | 90 |
| 09. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 3 | 76 | 2 | 81 |
| 10. | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 2 | 62 | 4 | 68 |
| 11. | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 6 | 39 | 13 | 58 |
| 12. | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | - | 58 | - | 58 |
| 13. | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | - | 52 | 2 | 54 |
| 14. | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | - | 33 | 4 | 37 |
| 15. | සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | 1 | 34 | - | 35 |
| 16. | කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යනායතනය | - | 23 | 1 | 24 |
| 17. | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාය | 6 | 16 | - | 22 |
| 18. | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 3 | 16 | - | 19 |
| 19. | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | - | 17 | 2 | 19 |
| 20. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | - | 16 | - | 16 |
| 21. | වව්නියා මණ්ඩපය- යාපනය විශ්වවිද්‍යාලය | - | 14 | 2 | 16 |
| 22. | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය | - | 15 | - | 15 |
| 23. | උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | - | 12 | - | 12 |
| 24. | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | - | 11 | - | 11 |
| 25. | ශ්‍රීපාලි මණ්ඩපය- කොළඹ විශ්වවිද්‍යාලය | - | 09 | - | 09 |
| 27. | තාක්ෂණ ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය | - | 07 | - | 07 |
| 28. | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 02 | 05 | - | 07 |
| 29. | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | - | 06 | - | 06 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 30. | මානව සම්පත් අභිවර්ධන ආයතනය | - | 06 | - | 06 |
| 31. | ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය | 03 | 02 | - | 05 |
| 34. | පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය | - | 02 | - | 02 |
| 35. | මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | - | 02 | - | 02 |
| 36. | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | - | 02 | - | 02 |
| 37. | ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය | - | 02 | - | 02 |
| 38. | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය | - | 02 | - | 02 |
| 39. | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | - | 01 | - | 01 |
| 40. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය-ප්‍රාදේශීය මධ්‍යස්ථානය - මඩකලපුව | - | 01 | - | 01 |
| | **මුළු ගණන** | **78** | **1,954** | **94** | **2,126** |

### 2.1.5 රාජකාරි විදේශ ගමන් බලපත්‍ර

අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුලු රාජකාරි විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් සඳහා 2018 වර්ෂය තුළ පහත පරිදි රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇත.

| අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය | එකතුව |
|---|---|---|
| 06 | 13 | 19 |

### 2.1.6 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා පුරවැසියකු නොවන ආරාධිත ආචාර්ය වරුන්ගේ සේවාව ලබා ගැනීම

| විශ්වවිද්‍යාලය හෝ ආයතනය | සංඛ්‍යාව |
|---|---|
| යාපනය විශ්වවිද්‍යාලය | 04 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 01 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 01 |
| එකතුව | 06 |

### 2.1.7 2018 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභා

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 39 |
| 2018.12.31 දක්වා තීරණ ලැබී නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 09 |
| පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව | 13 |
| පිළිතුරු සපයා ඇති ස්ථාවර නියෝග යටතේ අසනු ලබන ප්‍රශ්න | 02 |
| 2018 වර්ෂය තුළ මහජන පෙත්සම් කාරක සභාවෙන් ලැබුණු ලිපි | 05 |
| 2018 වර්ෂය තුළ වාර්තා යවන ලද මහජන පෙත්සම් කාරක සභා ලිපි | 05 |

### 2.1.8 තොරතුරු පනත අනුව ක්‍රියා කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් සම්බන්ධව 2018 වර්ෂය තුළ ක්‍රියා කිරීම පහත සාරාංශ කර ඇත.

| වර්ෂය තුළදී ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව | සපයන ලද තොරතුරු ප්‍රමාණය | වෙනත් ආයතන වෙත යොමු කරන ලද තොරතුරු ප්‍රමාණය | කොමිෂන් සභාවේ විධානය පරිදි තොරතුරු සපයන ලද වාර ගණන | 2018 වර්ෂයේ අභියාචන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 26 | 13 | 13 | 1 | 3 |

### 2.1.9 විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ වාර්ෂික ගිණුම් හා පාලන වාර්තා

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය යටතේ පවතින විශ්වවිද්‍යාල, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයද ඇතුළුව ආයතන 37ක වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

| වර්ෂය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 2017 වර්ෂය | නිරීක්ෂණ සඳහා අමාත්‍යාංශය වෙත එවා නොමැති වාර්ෂික වාර්තා | 02 |
| | සාකච්ඡා කිරීම සඳහා අමාත්‍යාංශය වෙත භාර දී ඇති වාර්ෂික වාර්තා කෙටුම්පත් | 05 |
| | සාකච්ඡා කිරීමෙන් පසු, භාෂාත්‍රයෙන් එවීමට ලිපි යවා ඇති වාර්ෂික වාර්තා | 24 |
| | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා | 06 |
| 2016 වර්ෂය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා | 02 |
| | පාර්ලිමේන්තුව වෙත භාර දී ඇති වාර්ෂික වාර්තා | 35 |

### 2.1.10 ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා ඇතුළු සියළුම නඩත්තු වියදම්

| කාර්යය | 2018 වසරේදී දරන ලද වියදම සහ පියවන ලද බිල්පත් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂක සේවා | රු. 3,539,680.00 |
| සනීපාරක්ෂක සේවා | රු. 3,634,320.78 |
| තැපැල | රු. 386,000.00 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | රු. 774,626.22 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම් | රු. 812,624.75 |
| විදුලිය | රු. 5,974,538.34 |
| ජලය | රු. 367,635.54 |
| කාර්යාල දුරකථන | බිල්පත් 624 |
| ෆැක්ස් | බිල්පත් 20 |
| අමාත්‍යාංශ අන්තර්ජාල සම්බන්ධතා | බිල්පත් 36 |

### 2.1.11 ප්‍රවාහන පහසුකම් සැපයීම

2018 වර්ෂයේදී අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම

| කාර්යය | 2018 වර්ෂයේ වියදම (රු.) |
|---|---|
| සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම හා අතිරේක ඉන්ධන සැපයීම | 1,583,698.68 |
| වාහන අළුත්වැඩියා කිරීම | 6,717,201.57 |
| නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම, අතිරේක ඉන්ධන ලබා දීම හා ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම | 9,391,881.00 |
| වාහන රක්ෂණය කිරීම හා අදාළ බලපත්‍ර ලබා දීම සම්බන්ධ කටයුතු | 1,970,899.15 |
| දුම් පරීක්ෂණ | 21,000.00 |
| රියදුරන් සඳහා අතිකාල හා ගමන් වියදම් | 3,730,256.51 |
| වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි හා අනෙකුත් උපාංග සපයා දීම | 1,461,146.51 |
| එකතුව | 24,876,083.42 |


### 2.1.12 ණය

2018 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති ආපදා ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර

| ණය/අත්තිකාරම් වර්ගය | නිලධාරීන් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල (රු.) |
|---|---|---|
| ආපදා ණය | 40 | 1,500,000.00 |
| විශේෂ අත්තිකාරම් | 16 | 64,000.00 |
| උත්සව අත්තිකාරම් | 54 | 540,000.00 |

## 2.2. ගිණුම් අංශය

**සංවිධාන සටහන**



### 2.2.1. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා මූල්‍ය ආයෝජනය

2018 වර්ෂයේදී උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 117 යටතේ උසස් අධ්‍යාපන අංශය සඳහා රු. බිලියන **16.15** ක ප්‍රතිපාදන සලසා දෙන ලදී. එයින් රු. බිලියන **11.84** ක වියදමක් දරා **73%** ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගෙන ඇත.

**2018.12.31 දිනට පුනරාවර්තන වියදම් සාරාංශය**

(රු.මිලියන)

| අයිතමය/විස්තරය | 2018 ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **අමාත්‍ය කාර්යාලය** | **32.39** | **32.26** | **0.13** | **99.6** |
| පුද්ගල පඩිනඩි | 15.47 | 15.47 | 0.00 | 100.0 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 16.92 | 16.79 | 0.13 | 99.6 |
| **පරිපාලන හා ආයතනික සේවා** | **522.94** | **175.65** | **347.29** | **88.54** |
| පුද්ගල පඩිනඩි | 74.95 | 74.09 | 0.86 | 98.8 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 85.31 | 84.99 | 0.32 | 99.6 |
| අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක ව්‍යාපෘති | 362.67 | 16.57 | 346.10 | 4.5 |
| **උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය** | **1,299.50** | **1,299.50** | **0.00** | **100.0** |
| එකතුව | **1,854.83** | **1,507.42** | **347.41** | **81.27** |

**2018.12.31දිනට මූලධන වියදම් සාරාංශය**

(රු.මිලියන)

| අයිතමය/විස්තරය | 2018 ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදන ඉතිරිය | ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **අමාත්‍ය කාර්යාලය** | **6.26** | **6.16** | **0.10** | 98.3 |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 2.81 | 2.71 | 0.10 | 96.3 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 3.45 | 3.45 | 0.00 | 100.0 |
| **පරිපාලන හා ආයතනික සේවා** | **3,885.95** | **2,655.92** | **1,230.03** | **68.4** |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 4.40 | 3.89 | 0.51 | 88.3 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 5.47 | 5.47 | 0.00 | 100.0 |
| අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක ව්‍යාපෘති | 1,533.54 | 436.90 | 1,096.64 | 15.3 |
| නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 2,043.61 | 2,043.61 | 0.00 | 100.0 |
| ලැප්ටොප් ණය ව්‍යාපෘතිය | 297.73 | 164.86 | 132.87 | 55.3 |
| සේවක පුහුණු වැඩසටහන් | 1.19 | 1.19 | 0.00 | 100.0 |
| **උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති** | **9,579.20** | **6,872.73** | **2,706.48** | **71.7** |
| සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 60.00 | 0.00 | 60.00 | 0.0 |

| | | | | |
|---|---|---|---|---|
| අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය | 166.00 | 166.00 | 0.00 | 100.0 |
| ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම - කිලිනොච්චිය | 79.66 | 29.47 | 50.19 | 37.0 |
| කෘෂිකර්ම පීඨය ස්ථාපනය කිරීම - කිලිනොච්චිය | 85.61 | 26.68 | 58.93 | 31.2 |
| පර්යේෂණ සංවර්ධනය- නෝර්වීජියානු ධාරිතා වර්ධන වැඩසටහන | 1.00 | 0.08 | 0.92 | 7.8 |
| රුහුණු විශ්වවිද්‍යාලයේ කලාගාරය ඉදිකිරීම | 140.23 | 138.06 | 2.17 | 98.4 |
| වසෝ ඒෂියා ව්‍යාපෘතිය | 39.22 | 39.22 | 0.00 | 100.0 |
| පර්යේෂණ හා පුහුණු සංකීර්ණය ඉදිකිරීම - යාපනය විශ්වවිද්‍යාලය | 912.37 | 748.55 | 163.82 | 82.0 |
| උසස් අධ්‍යාපනය සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 712.60 | 449.53 | 263.07 | 63.1 |
| **සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදි කිරීම නැගෙනහිර විශ්වවිද්‍යාලය** | 288.70 | 31.36 | 257.34 | 10.8 |
| **පර්යේෂණ හා සංවර්ධනය** (Reducing Cardiometabolics) **-ඔස්ට්‍රියා** | 5.09 | 4.21 | 0.88 | 82.8 |
| වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 280.00 | 5.69 | 274.31 | 2.0 |
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | 1,450.00 | 28.21 | 1,421.79 | 1.9 |
| පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය (Nanomaterials & Clean Energy) | 15.00 | 15.00 | 0.00 | 100.0 |
| නැගෙනහිර වි.වි හා පේරාදෙණිය වි.වි සඳහා වෛද්‍ය උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය | 764.61 | 739.51 | 25.10 | 96.7 |
| ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 124.12 | 0.00 | 124.12 | 0.0 |
| මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය සඳහා ලබාගත් ණය පියවීම | 4,389.96 | 4,389.96 | 0.0 | 100.0 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආර්ථික විශ්ලේෂණ වැඩසටහනක් සකස් කිරීම | 3.82 | 0.00 | 3.82 | 0.0 |
| නවක වදය හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ (යුනිසෙෆ්) ව්‍යාපෘතිය | 10.60 | 10.60 | 0.00 | 100.0 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය නෝර්වීජියානු ආධාර පර්යේෂණ ව්‍යාපෘතිය | 2.59 | 2.59 | 0.00 | 100.0 |
| කැලණිය විශ්වවිද්‍යාලයීය IAEA ආධාර පර්යේෂණ ව්‍යාපෘතිය | 48.01 | 48.01 | 0.00 | 100.0 |
| **උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය** | **826.64** | **801.82** | **24.82** | **97.0** |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 500.00 | 500.00 | 0.00 | 100.0 |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 218.64 | 195.32 | 23.32 | 89.34 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 108.00 | 106.50 | 1.50 | 98.61 |
| **එකතුව (මූලධන වියදම්)** | **14,298.05** | **10,336.63** | **3,961.42** | **72.29** |

**2018 වර්ෂය සඳහා අක්මුදල් ලැබීම් විස්තර**

| අග්‍රිම ගිණුම් අංකය | භාණ්ඩාගාරයෙන් හා වෙනත් මූලාශ්‍ර වලින් ලද අක්මුදල් ප්‍රමාණය (රු.) | වියදම් කරන ලද ප්‍රමාණය (රු.) | අක් මුදල් භාවිතයේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 7003/0000/00/0332/00/0018000 | 7,672,847,342 | 7,672,847,342 | 100 |
| 7003/0000/00/0054/00/0018000 | 197,000,000 | 194,137,604 | 99 |

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**

| | වියදම (රු.) | ලැබීම් (රු.) | හර ශේෂ (රු.) |
|---|---|---|---|
| 2018.12.31 දිනට සත්‍ය අගයන් | 7,490,200.32 | 4,211,668.36 | 16,573,591.81 |

- <u>**ගිණුම් අංශය මගින් ක්‍රියාත්මක කරන ලද මූල්‍ය හා ගිණුම්කරණ කාර්යයන්**</u>

| | කාර්යය | ක්‍රියාත්මක කල යුතු දිනය / කාල සීමාව | ක්‍රියාත්මක කල දිනය |
|---|---|---|---|
| 01 | මු.රෙ. 135 අනුව මූල්‍ය අධිකාරී බලය පැවරීම | 2018 වර්ෂය සඳහා අදාල අධිකාර බලය ලේකම්වරයාගේ අත්සනින් පවරා ඇත. | |
| 02 | රු. 500,000/-ට වැඩි මූලධන වියදම් දැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම | 1971 අංක 38 මුදල් පනත අනුව අධිකාරී බලය පැවරීමට කටයුතු කර ඇත. | |
| 03 | 2018 වාර්ෂික ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2019.02.28 දිනට පෙර | 2019.03.07 |
| 04 | 2018 පොදු තැන්පත් ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2019.03.31 දිනට පෙර | 2019.01.10 |
| 05 | 2018 රජයේ නිලධාරීන්ගේ ණය අත්තිකාරම් බී ගිණුම සකස්කර විගණකාධිපතිට ඉදිරිපත් කිරීම | 2019.03.31 දිනට පෙර | 2019.02.21 |
| 06 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | 2019.03.31 දිනට පෙර | 2019.02.15 |
| 07 | බැංකු සැසඳුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම | ඊළඟ මස 15 දිනට පෙර | ඊළඟ මස 15 දිනට පෙර |

- 2018 වර්ෂයට අදාලව අමාත්‍යාංශය සතු සියළුම වත්කම් තක්සේරු කොට ගිණුම් ගත කර ඇත. 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී හඳුනාගත් භාණ්ඩ අපහරණය කිරීමේ කටයුතු ද 2018 වර්ෂය තුලදී අවසන් කර ඇත.
- **2018** වර්ෂයේ විගණන විමසුම් 11 ක් ලැබී ඇති අතර එම විමසුම් 11 සඳහා නියමිත කාලයේදී පිළිතුරු යවා ඇත.
- ගිණුම් අංශය මගින් මාසික ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම, වාර්ෂික ප්‍රතිපාදන වෙන්කර දීම, මාසික අග්‍රිම අවශ්‍යතාවයන්ට අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන අදාල ආයතන වෙත නිකුත් කිරීම, අතුරු අග්‍රිම පවත්වා ගෙන යාම, අග්‍රිම සැසඳීම් සිදුකිරීම, පොදු තැන්පත් ගිණුම් හා ණය අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාම, වවුචර් සඳහා ගෙවීම් කිරීමේ කාර්යයන්, සරප් කටයුතු ආදී දෛනික හා මාසික කාර්යයන් කාලානුරූපව අප්‍රමාදව ඉටුකර ඇත .

## 2.3. යටිතල පහසුකම් සංවර්ධන අංශය

**සංවිධාන සටහන**

අතිරේක ලේකම් (පාලන හා මුදල්)

අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන)

ඉංජිනේරු

සංවර්ධන නිලධාරී (04)

### 2.3.1. යටිතල පහසුකම් සංවර්ධන අංශයේ කාර්යභාරය

- සියලු වැඩ ප්‍රසම්පාදන කාර්යන් 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි හා 2018 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව ඉටු කිරීම.

- ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව හා වාර්ෂික ඇස්තමේන්තුවෙන් සැලසී ඇති ප්‍රතිපාදන අනුව කාර්යක්ෂමව හා සඵලදායිව අදාල සේවාවන් සැපයීම

- රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කර එවනු ලබන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යන ආයතනයන්ගෙන් ලැබෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමකට ලක්කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ ව්‍යාපෘති යෝජනා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.

- ව්‍යාපෘතිවලට අදාල රේට් අනුමැතීන් ලබා ගැනීමට විශ්වවිද්‍යාල වෙතින් ලැබෙන ලිපිලේඛණ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

- නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුව මගින් ව්‍යාපෘතිවලට අදාල අනුමත කරන ලද ප්‍රමාණ පත්‍ර (BOQ) අදාල විශ්වවිද්‍යාලය වෙත යොමුකිරීම.

## 2.3.2. 2018 වර්ෂයේ යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් ඉටු කරන ලද කාර්යභාරය

### 01. සේවා ප්‍රසම්පාදන

සේවා ප්‍රසම්පාදන සම්බන්ධයෙන් 2018 වර්ෂය තුල දී කරන ලද කාර්යයන්,

- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටු, අමාත්‍යාංශ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කර ලබාදීම.

- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කරගැනීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.

- ලංසු උපලේඛන ගත කර අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.

- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගෙන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම.

### 02. උපදේශන සේවා

බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාපෘතින්හි ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කල පසු අදාල ඉදිකිරීම් ආරම්භ කිරීම හා අවසන් කිරීම සඳහා දිර්ඝ කාලයක් ගත වන අවස්ථාද, එම ව්‍යාපෘති කාලය මෙන්ම පිරිවැය ද දෙගුණ වු අවස්ථා ද නිරීක්ෂණය විය. ඒ පිලිබඳ සොයා බැලීමේදී පෙනි ගියේ උපදේශකවරයෙකු තෝරා ගැනීමේ සුළු කාර්යයකදී පවා ඉතා විශාල කාලයක් ගත කර ඇති බවයි.

ඊට විසඳුමක් ලෙස අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ ඉදිකිරීම් වර්ගීකරණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව යෝජනා හා මිල ගණන් කැඳවා විශ්වවිද්‍යාල සඳහා අනුමත වන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශකවරුන්ගෙන් ලැයිස්තුවක් සකස් කර විශ්වවිද්‍යාල වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එවැනි ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය වෙනුවෙන් අධික කාලයක් වැය කොට විශ්වවිද්‍යාල සඳහා උපදේශකවරු පත්කර ගැනීම වෙනුවට වැඩි කාලයක් ගත නොකට මෙම ලැයිස්තුවෙන් උපදේකවරුන් තෝරා ගෙන කඩිනමින් නිර්මාණ වැඩ කටයුතු ආරම්භ කිරීමට අවකාශ සැලසී ඇත.

2018 වර්ෂය තුල අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් රු.බිලි. 11.6 වටිනාකමින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති 17 ක ප්‍රසම්පාදන ආරම්භ කර ඇත.

| අංකය | විශ්ව විද්‍යාලය | ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය | ප්‍රසම්පාදන ආරම්භ කිරීම | ව්‍යාපෘති කාලය (මාස) | ව්‍යාපෘති වටිනාකම රු. මි |
|---|---|---|---|---|---|---|
| 1 | රජරට | නේවාසිකාගාර පරිශ්‍රය තුල ශිෂ්‍ය ආපනශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.09.11 | 18.09.26 | 18 | 107 |
| 2 | | කෘෂිකර්ම පීඨය සඳහා විද්‍යාගාර සංකීර්ණයක් හා දේශන ශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.09.11 | 18.09.26 | 30 | 759 |
| 3 | භික්ෂු | බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.07.03 | 18.07.18 | 24 | 486 |
| 4 | යාපනය | වව්නියා මණ්ඩපය සඳහා තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.02.14 | 18.03.02 | 24 | 467 |
| 5 | වයඹ | තාක්ෂණ පීඨය සඳහා (අදියර 2) ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.04.03 | 18.05.02 | 30 | 1,696 |
| 6 | ඌව වෙල්ලස්ස | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.01.16 | 18.02.08 | 12 | 108 |
| 7 | රුහුණ | තාක්ෂණ පීඨය සඳහා ලිබඩු සහිත තෙමහල් දේශන ශාලාව | 18.02.14 | 18.02.28 | 30 | 413 |
| 8 | | වෛද්‍ය පීඨය සඳහා නව මහාචාර්යය ඒකකය ස්ථාපිත කිරීම සඳහා මහල් 10ක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම | 18.04.03 | 18.05.02 | 30 | 1,300 |
| 9 | | ඉංජිනේරු පීඨය සඳහා නාවික අධ්‍යනය හා නාවික කටයුතු පිළිබඳ උපකරණ සහිත දක්ෂිණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 18.04.03 | 18.05.02 | 24 | 943 |
| 10 | | සම සෞඛ්‍ය පීඨය ස්ථාපිත කිරීම (අදියර 1) | 18.09.11 | 18.09.27 | 30 | 1,660 |
| 11 | | ප්‍රධාන පරිශ්‍රයේ ඇති ගොඩනැගිල්ලේ අළුත්වැඩියා වැඩ | 18.09.11 | 18.09.27 | 18 | 400 |
| 12 | | ක්‍රිඩාපිටිය වැඩිදියුණු කිරීම හා ක්‍රීඩා මණ්ඩපයක් ඉදිකිරීම | 18.06.21 | 18.07.18 | 15 | 640 |
| 13 | පා. බෞ. පශ්චාත් උ. | මහල් හතරක ගොඩනැගිල්ලක් (අදියර 1) ඉදිකිරීම | 18.02.14 | 2018.02.28 | 24 | 365 |
| 14 | කොළඹ | කලා පීඨයේ නව ගොඩනැගිලි දිගුව (අදියර 1) | 18.09.11 | 18.09.27 | 24 | 581 |
| 15 | අග්නිදිග | මල්වත්ත පිහිටි ඇග්‍රෝ ටෙක් පාර්ක්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 18.07.03 | 18.07.18 | 24 | 166 |
| 16 | | අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා නිල නිවාස ඉදිකිරීම | 18.07.03 | 18.07.18 | 24 | 345 |
| 17 | සබරගමුව | වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම සඳහා පැරා සායනික ගොඩනැගිල්ල | 18.09.11 | 18.10.01 | 24 | 1,169 |
| | | එකතුව | | | | 11,605 |


2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් රු. බිලියන 2.6 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති 10 ක කොන්ත්‍රාත් පිරිනමා ඇත.

| අනු අංකය | විශ්වවිද්‍යාලය | ව්‍යාපෘතිය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය | ප්‍රසම්පාදන ආරම්භ කිරීම | ප්‍රසම්පාදන අවසන් කිරීම | ව්‍යාපෘති වටිනාකම රු. මි. |
|---|---|---|---|---|---|---|
| 1 | පේරාදෙණිය | කලා පීඨය සඳහා සත්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.07.04 | 17.07.20 | 18.12.18 | 489 |
| 2 | | පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16.07.12 | 16.07.29 | 18.12.02 | 126 |
| 3 | | විජේවර්ධන ශාලාව නවීකරණය කිරීම | 17.03.28 | 17.04.21 | 18.02.12 | 240 |
| 4 | භික්ෂු | කාර්ය මණ්ඩලය සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 18.02.14 | 18.03.02 | 18.12.03 | 255 |
| 5 | | විදේශ සිසුන් සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.10.31 | 17.11.15 | 18.12.03 | 104 |
| 6 | ඌව වෙල්ලස්ස | සේවක ඉගැනුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 18.01.16 | 18.06.05 | 18.12.14 | 185 |
| 7 | යාපනය | පරිගනක විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16.12.20 | 17.01.10 | 18.12.17 | 240 |
| 8 | | පරිගණක මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.10.31 | 18.03.02 | 18.12.12 | 200 |
| 9 | ශ්‍රී ලංකා විවෘත | යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා මහල් හතරක ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 16.12.20 | 17.01.10 | 18.01.29 | 200 |
| 10 | සබරගමුව | ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා නව ගොඩනැගිල්ලක් (අදියර 2 හි 1 කොටස) ඉදිකිරීම | 17.07.04 | 17.07.19 | 18.09.12 | 564 |
| එකතුව | | | | | | 2,603 |

## 2.4. ප්‍රසම්පාදන අංශය

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) ගේ අධිකාරිය යටතේ ඇති ප්‍රසම්පාදන අංශය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) යටතේ ක්‍රියාත්මක වේ.


**සංවිධාන සටහන**




### 2.4.1 ප්‍රසම්පාදන අංශයේ කාර්යභාරය

- 2018 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම
- 2018 ප්‍රසම්පාදන කාර්යයන් ඇරඹීම සඳහා  අතිරේක ලේකම් (පාලන හා මුදල්) හා ලේකම්ගෙන් පූර්ව බලය ලබා ගැනීම.
- සියලුම අංශයන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් ඇණවුම් කර සැපයීම.
- සියලු ප්‍රසම්පාදන කාර්යන් 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි  හා 2018 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව ඉටු කිරීම.

මෙම කාලපරිච්ජේදයට අදාළව ප්‍රසම්පාදන අංශය විසින් ඉටු කරන ලද සියලු කටයුතු පහත පරිදි ගොනු කර දැක්විය හැකිය.



### 2.4.2 භාණ්ඩ සැපයුම් හා සේවා


භාණ්ඩ හා සේවා සැපයුම් සම්බන්ධයෙන් 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කරන ලද කාර්යයන්,

- සියලුම අංශයන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් ඇණවුම්කර සැපයීම සඳහා 2018 වසරේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කිරීම.
- ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් සැපිරීමට සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශ සුළු හා ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි ලබාදීම.
- ලංසු ලියකියවිලි සකස් කිරීම.
- ලංසු ලබාගැනීම සඳහා දැන්වීම පළකිරීම, මිල ගණන් කැඳවීම.
- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කිරීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.
- ලංසු උපලේඛන ගත කර අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගැනීම.
- ප්‍රසම්පාදනයන් සඳහා අනුමැතිය ලද පසු භාණ්ඩ ඇණවුම් කර ලබා ගැනීම.
- ඇණවුම් කරන ලද භාණ්ඩ හා උපකරණ නියමිත දිනට ගෙන්වාගෙන ගබඩාව වෙත යොමු කිරීම.
- ගබඩාවෙන් සැපයුම්කරුගේ බිල්පත හා භාණ්ඩ ලැබීම් තුණ්ඩුව ප්‍රසම්පාදන අංශයට ලැබීමෙන් පසු වවුචර් පත් සකසා ගෙවීම් සඳහා පාලන අංශය වෙත යොමු කිරීම.
- අදාල භාණ්ඩ පිළිබඳ ලැබෙන වගකීම් සහතිකපත් පාලන අංශය වෙත යොමු කිරීම.
- සුළු මුදලින් මිලදීගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු කිරීම.
- උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතන සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු හා උපදේශන ප්‍රසම්පාදන කමිටු පත්කිරීම.

## 2.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. එසේම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ කාර්යක්ෂමතාවය හා තත්වය ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන සැකසීම ආදී කටයුතු මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

**සංවිධාන සටහන**




### 2.5.1. තොරතුරු හා සන්නිවේදන අංශයේ කාර්යභාරය

- 2018 තොරතුරු තාක්ෂණ සැලැස්ම සකස් කිරීම.
- 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොළී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ රාජකාරි කටයුතු සිදු කිරීම
- උසස් අධ්‍යාපන අංශයේ වෙබ්අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම
- පරිගණක වට්ටෝරු තොරතුරු පද්ධතිය (Computer Inventory Information System) නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම.
- තෝරාගත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල wi-fi පහසුකම් තවදුරටත් පුළුල් කිරීම.
- අමාත්‍යාංශයේ ඇති පරිගණක, Laptop යන්ත්‍ර,Tabs සහ මුද්‍රණ යන්ත්‍ර වල දෘඩාංග දෝෂ නිරාකරණය.
- පරිගණකවල මෘදුකාංග දෝෂ අන්තර්ජාල හා e-mail ගැටළු නිවැරදි කිරීම.
- අංශවල අවශ්‍යතාවය අනුව පරිගණක වලට භාවිත මෘදුකාංග ඇතුලත් කිරීම, නඩත්තු කිරීම හා ගැටළු නිරාකරණය කිරීම.
- අමාත්‍යාංශයේ පරිගණක ආරක්ෂාව සඳහා වෛරස් මෘදුකාංග ඇතුලත් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම, වෛරස් කොන්සෝල් පද්ධතිය නඩත්තු කිරීම.
- පරිගණක ජලය නඩත්තු කිරීම ඊට අදාල ගැටළු විසඳීම හා අවශ්‍යතවය අනුව ජාල සම්බන්ධතාවයන් පුළුල් කිරීම.
- පරිගණක ජාල පරිපාලක මධ්‍යස්ථානයේ ඇති Proxy Server, Firewall Server, e-mail server, Virus Console Server හා උසස් අධ්‍යාපන විදේශ නිවාඩු මෘදුකාංග Server යනServer යන්ත්‍ර පරිපාලනය.
- උසස් අධ්‍යාපන විදේශ නිවාඩු මෘදුකාංග පද්ධතිය නඩත්තු කිරීම හා සංවර්ධන අංශයේ අවශ්‍යතාවය අනුව අදාල ආකෘති සකස් කර දීම.

- අමාත්‍යාංශයේ දැනට ස්ථාපිත Wi-Fi පද්ධතිය නඩත්තු කිරීම හා වරින් වර ඇතිවන තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම.
- අමාත්‍යාංශයට අවශ්‍ය පරිගණක දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමේදී අදාල තාක්ෂණික කමිටු නියෝජනය
- තොරතුරු තාක්ෂණ පද්ධති මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ අවධිවලදී දායකත්වය ලබා දීම.
- අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටු නියෝජනය කිරීම.
- අමාත්‍යාංශයේ CIO ලෙස ICTA ආයතනය නියෝජනය කිරීම.
- ICTA මගින් ක්‍රියාත්මක කරන Cross Government, LGN, Data Center, Spatial Data යන ව්‍යාපෘති කටයුතුවලට දායකත්වය ලබා දීම.
- අමාත්‍යාංශයේ පරිගණක හා තොරතුරු තාක්ෂණ උපාංග වලට අදාල වත්කම් ලේඛනය සකස් කිරීම.
- තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.

### 2.5.2 තොරතුරු හා සන්නිවේදන අංශය 2018 වර්ශයේ දී ඉටු කරන ලද කාර්යභාරය

**01. 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොලී රහිත ණය ලබාදීම යටතේ**

**2018 වසරේ ණය ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ගෙවා ඇති පොලී මුදල් ප්‍රමාණය**

| මාසය | ලංකා බැංකුව | | මහජන බැංකුව | |
|---|---|---|---|---|
| | සිසුන් සංඛ්‍යාව | පොලී මුදල් ප්‍රමාණය (රු) | සිසුන් සංඛ්‍යාව | පොලී මුදල් ප්‍රමාණය (රු) |
| ජනවාරි | 10,526 | 4,713,009.79 | 12,409 | 4,250,701.42 |
| පෙබරවාරි | 9,513 | 4,116,882.78 | 12,402 | 5,387,010.35 |
| මාර්තු | 10,730 | 3,970,682.69 | 12,368 | 4,862,939.86 |
| අප්‍රේල් | 10,746 | 4,156,886.69 | 12,343 | 4,941,471.65 |
| මැයි | 10,673 | 3,838,772.09 | 12,296 | 4,620,839.03 |
| ජුනි | 10,689 | 3,750,343.92 | 12,214 | 4,420,493.07 |
| ජූලි | 10,706 | 3,590,216.14 | 12,075 | 4,057,587.46 |
| අගෝස්තු | 10,764 | 3,876,938.71 | 11,881 | 3,856,955.36 |
| සැප්තැම්බර් | 10,844 | 3,776,522.66 | 11,715 | 3,593,639.99 |
| ඔක්තෝබර් | 10,937 | 3,695,466.83 | 11,574 | 3,270,322.83 |
| නොවැම්බර් | 11,114 | 4,039,016.3 | 11,479 | 3,081,711.52 |
| දෙසැම්බර් | 11,045 | 3,911,540.7 | 10,442 | 2,547,949.44 |
| එකතුව | | 47,436,279.30 | 143,198 | 48,891,621.98 |

විශ්වවිද්‍යාල අනුව ලැප්ටොප් පරිගණක ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව (2018 දෙසැම්බර් දක්වා)

| විශ්වවිද්‍යාලය | ලැප්ටොප් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 2,640 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2,256 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 2,366 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 2,356 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 1,987 |
| ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 1,856 |
| යාපනය විශ්වවිද්‍යාලය | 1,345 |
| සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය | 1,178 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 1,356 |
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 1,054 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 1,954 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 1,702 |
| ශ්‍රී ලංකා රජ රට විශ්වවිද්‍යාලය | 2,156 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 1,605 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 1,470 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 213 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 401 |
| මුළු ගණන | **27,895** |

**02. උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම ඊට අදාළ නව තොරතුරු ඇතුලත් කිරීම.**

| අංශය | තොරතුරු | ප්‍රමාණය (සිංහල) | ප්‍රමාණය (ඉංග්‍රීසි) | ප්‍රමාණය (දමිළ) |
|---|---|---|---|---|
| සංවර්ධන අංශය | දේශීය හා විදේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව ,රාජ්‍ය සේවකයන් සඳහා විදේශීය පුහුණු සැසි හා දැන්වීම්. | 50 | 50 | 50 |
| අතිරේක ලේකම් (සංවර්ධන) | වෙබ් අඩවියේ මුහුණත් වෙනස් කිරීම් අලුත් අංග ඇතුලත් කිරීම හා වෙනත් වෙබ් අඩවි වලට සම්බන්ධ කිරීම්. | 15 | 15 | 15 |
| මාධ්‍ය අංශය | මුල්ගල් තැබීම්, වැඩ බාර ගැනීම්, විවෘත කිරීම් සම්බන්ධ ජයාරූප හා ලිපි. | 08 | 08 | 08 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය. | ලැප්ටොප් පරිගණක පිළිබඳ මිළ ගණන් ලැයිස්තු, ශිෂ්‍යාණය ව්‍යාපෘතිය. | 04 | 04 | 04 |
| ප්‍රසම්පාදන | ටෙන්ඩර් දැන්වීම් පලකිරිම. | 03 | 03 | 03 |
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත උපාධි පාඨමාලා ලැයිස්තු. | 09 | 09 | 09 |
| සැලසුම් අංශය | පුරප්පාඩු පලකිරිම | 03 | 03 | 03 |
| පාලන | පුරප්පාඩු පලකිරිම | 05 | 05 | 05 |

### 03. උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නවීකරණය කර සකස් කිරීම.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) දායකත්වය සහිතව, උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නව මුහුණුවරකින් සකස් කිරීම, නිවාඩු කළමනාකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය සඳහා නව මාර්ගගත (Online) සේවාවන් සකස් කර වෙබ් අඩවිය හරහා ලබා දීමට සැලසුම් කිරීම, මීට අමතරව රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල අංශයට අදාළ උපාධි හා උපාධි ලබාදෙන පෞද්ගලික විශ්වවිද්‍යාල ලියාපදිංචි කිරීම සඳහා ද මාර්ගගත තොරතුරු තාක්ෂණික පද්ධතිය සකස් කිරීම, උසස් අධ්‍යාපන අංශයේ නව වෙබ් අඩවියේ නිර්මාණය කිරීම, රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (http://gic.gov.lk) වෙබ් අඩවියේ ඇති උසස් අධ්‍යාපන අංශයේ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම ආදී කටයුතු මේ යටතේ සිදු කෙරේ.

2016 අයවැය යෝජනාවට අනුව රාජ්‍ය විශ්වවිද්‍යාලවල Wi-Fi පසුකම් තවදුරටත් පුළුල් කිරීම සඳහා රුහුණු විශ්වවිද්‍යාලය, පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය සහ ත්‍රිකුණාමලය මණ්ඩපය, යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපය හා ඉංජිනේරු පීඨය, ශ්‍රීපාලි මණ්ඩපය යන උසස් අධ්‍යාපන ආයතන 2018 වර්ෂයේ තෝරාගෙන ඇති අතර ඒ සඳහා රු.මි.160ක් ලබා දී ඇත.

ඉහත දැක්වෙන සෑම ආයතනයකින්ම සාමාජිකයෙකු නියෝජනය වන පරිදි සාමාජිකයන්ගෙන් සැදුම් ලත් තාක්ෂණික කමිටුවක් පත්කර සුදුසුකම් ලත් Wi-Fi සේවා සපයන්නෙකු තෝරා ගැනීමේ කටයුතු සිදු කර ඇත.මේ සඳහා **Wi-Fi** සේවා සපයන ආයතන 5 ක පිරිවිතර තාක්ෂණික කමිටුව මගින් අධ්‍යනය කිරීම අවසන් කර ඇති අතර සේවා සපයන ආයතනයක් නිර්දේශ කර ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් ලබා දී ඇති Fee Wi-Fi පහසුකම් සපයන ලද විශ්වවිද්‍යාල පහත දැක්වේ.

| **දිස්ත්‍රික්කය** | **විශ්වවිද්‍යාලය / ආයතනය** | **Wi-Fi ස්ථාන** |
|---|---|---|
| අනුරාධපුර | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ,මිහින්තලේ හා සාලියපුර | 2 |
| බදුල්ල | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 2 |
| කොළඹ | බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය - කොළඹ 7 | 2 |
| කොළඹ | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල - කොළඹ | 5 |
| කොළඹ | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - පිටිපන , හෝමාගම | 1 |
| කොළඹ,කළුතර | කොළඹ විශ්වවිද්‍යාලය -තුම්මුල්ල සහ වෛද්‍ය පීඨය, ශ්‍රීපාලි මණ්ඩපය | 3 |
| කොළඹ | සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය | 1 |
| කොළඹ | මොරටුව විශ්වවිද්‍යාලය | 1 |
| ගාල්ල | රුහුණු විශ්වවිද්‍යාලය - වෛද්‍ය පීඨය | 2 |
| ගම්පහ | කැලණිය විශ්වවිද්‍යාලය | 1 |
| යාපනය | යාපනය විශ්වවිද්‍යාලය, පූර්ව උපාධි අංශය හා වව්නියා මණ්ඩපය | 3 |
| මහනුවර | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 1 |
| කිලිනොච්චිය | යාපනය විශ්වවිද්‍යාලය / කිලිනොච්චිය | 1 |
| කුරුණෑගල | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 1 |
| මාතර | රුහුණු විශ්වවිද්‍යාලය / - මාතර වැල්ලමඩම | 3 |
| රත්නපුර | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 1 |
| ත්‍රිකුණාමලය | නැගෙනහිර විශ්වවිද්‍යාල , ත්‍රිකුණාමල මණ්ඩපය | 2 |
| අම්පාර | අග්නිදිග විශ්වවිද්‍යාල | 2 |
| **එකතුව** | | **34** |

**තොරතුරු තාක්ෂණ අංශය විසින් අමාත්‍යාංශය තුල සපයන ලද සේවාවන් පහත දැක්වේ.**

| සේවා සැපයුම් විස්තරය | වාර්තා කරන ලද හා නිරාකරණය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව ( 2018.01.01 සිට 2018.12.31 දක්වා ) |
|---|---|
| අන්තර්ජාලට පිවිසීමේදී ඇති ගැටළු | 55 |
| E-Mail පිළිබද ගැටළු | 30 |
| මෘදුකාංග යාවත්කාලීන කිරීම් | 30 |
| නව මෘදුකාංග ස්ථාපනය කිරීම් | 40 |
| සුළු දෘඩාංග ගැටළු | 40 |
| පරිගණක මුද්‍රණ ගැටළු | 45 |
| පරිගණක මුද්‍රණ යන්ත්‍ර වල දෝශ | 15 |
| WI-FI පිළිබද ඇතිවන ගැටළු | 30 |
| ජාලකරණ ගැටළු | 20 |
| වෛරස් මගින් ඇති වන ගැටළු | 15 |
| Share Folder වල ඇති වන ගැටළු | 15 |
| N  පරිගණක වලින් ඇති වන ගැටළු | 10 |

**මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කරනු ලැබූ පරිගණක සංඛ්‍යාව ( 2018.01.01 සිට 2018.12.31)**

| අංශය | පරිගණක සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන අංශය | 6 |
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය | 6 |
| තොරතුරු තාක්ෂණ අංශය | 8 |
| අභ්‍යන්තර විගණනය අංශය | 3 |
| මුදල් අංශය | 7 |
| රජයේ විගණනය අංශය | 6 |
| ප්‍රසම්පාදන අංශය | 5 |
| පාලන අංශය | 4 |
| සහකාර අධ්‍යක්ෂ | 1 |

**මෘදුකාංග භාවිතාකර තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු වඩාත් කාර්යක්‍ෂමව සිදු කරනු ලැබේ. මුදල් අමාත්‍යාංශයට යවන වාර්තා ස්වයංක්‍රීයව මෙම පද්ධතියෙන් ලබා ගනු ලැබේ.**

| මාසය | තීරු බදු රහිත වාහන බලපත්‍ර නිකුතුව |
|---|---|
| ජනවාරි | අවශ්‍යතා ලබාගැනීම |
| පෙබරවාරි | මෘදුකාංග සංවර්ධනය |
| මාර්තු/අප්‍රේල් | මෘදුකාංග පරීක්ෂා කිරීම |
| මැයි | මෘදුකාංග භාවිතය ආරම්භ |
| | 200 |
| ජුනි | 700 |
| ජූලි | 1,400 |
| අගෝස්තු | 600 |
| සැප්තැම්බර් | 463 |
| ඔක්තෝබර් | 131 |
| නොවම්බර් | 69 |
| දෙසැම්බර් | 23 |

## Cross Government Document Management System of ICTA


ICTA ආයතනය මගින් ක්‍රියාත්මක කරණ Cross Government Document Management System ව්‍යාපෘතිය සඳහා සේවා සපයන සමාගමක් තෝරාගෙන ඇත. රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල අංශයේ කාර්යයන් සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම ආරම්භ කර ඇත.දැනට මෙම පද්ධතිය සඳහා අවශ්‍ය වන පද්ධති අවශ්‍ය පිරිවිතර (SRS) ලියවිල්ල සකස් කිරීම අවසාන අදියරේ පවතී.

ශිෂ්‍ය ණය ව්‍යාපෘතිය සඳහා වන On line පද්ධතියේ ශිෂ්‍යයන් පසුවිපරම් (Monitoring) කිරීමට අදාල මොඩියුලය (Module) අලුතින් නිර්මාණය කරන ලදී.

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ විදේශ නිවාඩු සඳහා තොරතුරු පද්ධතියක් සකස් කිරීම යටතේ මෙහි තොරතුරු පද්ධතිය සංවර්ධන කටයුතු කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන පාසලට අයත් තීක්ෂණ ආයතනයට ලබා දී ඇත.

## 2.6 සංවර්ධන අංශය

**සංවිධාන සටහන**




## 2.6.1. සංවර්ධන අංශයේ කාර්යභාරය

- ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර අත්සන් කරන ලද හා කරනු ලැබීමට නියමිත අවබෝධතා ගිවිසුම් සම්බන්ධ කටයුතු
- 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ නව පාඨමාලා ආරම්භ කිරීම, පාඨමාලා වෙනස්කිරීම, නව පීඨ හා අංශ ආරම්භ කිරීම ආදී නියමයන් හා නියමාවලි පළකිරීම
- රජයේ විශ්වවිද්‍යාල ස්ථාපනය හා පුලුල් කිරීම සඳහා ඉඩම් මිලදී ගැනීම හා අත්පත් කර ගැනීම පිළිබඳ සියලු කටයුතු

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අදාළ සියළුම කටයුතු (සේවක සංඛ්‍යා පිළිබඳ කරුණු හැර)
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උපාධි අධ්‍යාපන ආයතනයන්හි පාලක සභා/ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ සියලුම කටයුතු
- විදේශීය රටවලින් සහ උපාධි ප්‍රදාන ආයතනවලින් ලැබෙන ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරිම සම්බන්ධ සියලු කටයුතු (දැන්වීම් පළකිරීම, ඉල්ලුම්පත් නිර්නායක අනුව තේරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ තෝරාගත් අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් නිර්දේශ කොට එම රටවල්වලට / ආයතනවලට යොමු කිරීම)
- විදේශීය සිසුන් සඳහා ලබාදෙන ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධ සියළුම කටයුතු
- පොදු රාජ්‍ය මණ්ඩල ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධ සියලු කටයුතු
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලැබෙන කෙටි කාලීන පුහුණු පාඨමාලා පිළිබඳ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල කාර්ය මණ්ඩල දැනුවත් කිරීම හා උසස් අධ්‍යාපන ආයතන මඟින් ඉදිරිපත් කෙරෙන නාමයෝජනා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිම
- සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අයත් පශ්චාත් උපාධි ආයතන වෙතින් ලැබෙන විදේශ නිවාඩු ඉල්ලුම්පත් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා ගරු අමාත්‍යතුමාගේ අවසරය ලබා දීමට අදාළ කටයුතු
- විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩල එම ආයතන විසින් උපයන ලද අරමුදල් (Generated Funds) හා දේශිය අරමුදල් ප්‍රයෝජනයට ගෙන විදේශ චාරිකා සඳහා සහභාගිවීමේ දි වැයවන ප්‍රතිපාදනවලට අවශ්‍ය අනුමැතිය අමාත්‍යාංශ ලේකම්ගෙන් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.
- විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල නිලධාරීන් සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 431 අනුව යානාපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමට අදාළ කටයුතු.
- ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයන්හි හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන කටයුතුවල යෙදෙන විදේශ ශිෂ්‍යයන්ට හා මෙරට විශ්වවිද්‍යාලවලට පැමිණෙන කථිකාචාර්යවරුන් සඳහා මෙරටට ඇතුලුවීමේ සහ විසා දිර්ඝ කර ගැනීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි නිර්දේශ කර ආගමන විගමන පාලක වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු
- විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් හා උපකුලපතිවරුන් පත් කිරීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු
- විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ ගැටළු පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම
- උපාධි සහතික පිළිගැනීම හා සමාන කිරීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම/අදාළ ආයතනයන්ට ඉදිරිපත් කර පිළිතුරු ලබාදීමට කටයුතු කිරීම

- විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ගුවන් මඟින් ආනයනය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 368 අනුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදීමට අදාළ කටයුතු
- විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ආනයනය කිරීමේදී එවැනි භාණ්ඩ සඳහා තීරුබදු සහ වැට්බදු නිදහස් කිරීම/සහන සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් සඳහා 2012.11.08 දිනැති අංක 1783/18 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- මහපොළ භාරකාර අරමුදලේ කටයුතු

## 2.6.2 කුලපතිවරුන් හා උප කුලපතිවරුන් පත් කිරීම

(2018.01.01 සිට 2018.12.31 දක්වා)

| විශ්වවිද්‍යාලය | කුලපති | පත්වීම් දිනය | උප කුලපති | පත්වීම් දිනය |
|---|---|---|---|---|
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | පණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහානායක ස්වාමීන්වහන්සේ | 2018.01.16 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය ගල්ලැල්ලේ සුමනසිරි හිමි | 2017.10.30 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | - | | මහාචාර්ය උපුල් බණ්ඩාර දිසානායක | 2018.08.01 |
| විවෘත විශ්වවිද්‍යාලය | - | | මහාචාර්ය සැමුවෙල් අන්බාහන් අරියදුරෙයි | 2018.06.23 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | - | | මහාචාර්ය එම්.එම්.එම්. නජිම් | 2018.08.09 |

## 2.6.3 පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2013 – 2018 දක්වා

| රට | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| ඉන්දියාව | 37 | 31 | 20 | 27 | 31 | 34 |
| චීනය | 11 | 16 | 8 | 5 | 18 | 12 |
| ජපානය | 9 | 9 | 7 | 7 | 7 | 7 |
| රුසියාව | - | - | - | 3 | 2 | 6 |
| නවසීලන්තය | 1 | 1 | 2 | 1 | 2 | 1 |
| එක්සත් රාජධානිය | 7 | 7 | 8 | 8 | 7 | නාම යෝජනා යවා ඇත (ප්‍රතිඵල 2019 නිකුත් කරනු ලැබේ |
| **එකතුව** | **65** | **64** | **45** | **51** | **67** | **60** |

## 2.6.4 ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2013 - 2018 දින දක්වා

| රට | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| බංග්ලාදේශය | 5 | 7 | 9 | 6 | 12 | - |
| ඉන්දියාව | 115 | 133 | 152 | 139 | 116 | 105 |
| චීනය | 13 | 18 | 10 | 10 | ලැබී නැත | 10 |
| බෲනායි | - | - | 2 | - | ලැබී නැත | - |
| කොරියාව | 1 | 2 | - | - | - | - |
| කියුබාව | - | 2 | 2 | 1 | 1 | 1 |
| රුසියාව | 20 | 37 | 20 | 18 | 22 | 18 |
| පකිස්ථානය | 9 | 10 | 10 | 11 | 11 | 11 |
| සර්බියාව | 1 | 1 | 1 | 1 | - | - |
| මැසිඩෝනියාව | - | 1 | - | - | - | - |
| වියට්නාමය | 5 | 5 | 5 | - | 5 | 5 |
| ජපානය | 5 | 1 | 1 | 1 | 1 | ප්‍රතිඵල තවම ලැබී නැත |
| චීනය (Macao Foundation) | - | - | - | - | 1 | 2 |
| **එකතුව** | **174** | **217** | **212** | **187** | **169** | **152** |

## 2.6.5 විදේශිය සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන

වාර්ෂිකව විවිධ රටවල් විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ශ්‍රී ලාංකික සිසුන් සඳහා ප්‍රථම හා පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව දෙසීයකට අධික ප්‍රමාණයක් ප්‍රදානය කරනු ලබයි. එබැවින් විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපන අවස්ථාව ලබා දීම සඳහා 2011 වර්ෂයේදී "ශ්‍රී ලංකා රජය විදේශිය සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන " උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී.

මෙම ශිෂ්‍යත්ව අවස්ථා ලබා දීම මගින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳව විදෙස් රටවල ප්‍රචාරය වීමත් ඒ තුලින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා විදෙස් සිසුන් වැඩි වශයෙන් ආකර්ශනය කර ගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වේ.

ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2011 වසරේ සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව ප්‍රමාණය පහත පරිදි වේ. ඒ අනුව ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මේ වන විට ශිෂ්‍යත්ව ලාභී මුළු සිසුන් සංඛ්‍යාව 148 කි. මේ වන විට පශ්චාද් උපාධි සාර්ථකව හදාරන ලද පාකිස්තාන, නේපාල, භූතාන, නයිජීරියානු හා කොරියානු සිසුන් 47 දෙනෙකු තම රටවලට පිටත්ව ගොස් ඇත. සිසුන් 29 දෙනෙකු පාඨමාලා හැර ගොස් ඇත.

**ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව**

| ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව වර්ෂය | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 2011 | 05 |
| 2012 | 15 |
| 2013 | 44 |
| 2014 | 38 |
| 2015 | 26 |
| 2016 | 07 |
| 2017 | 13 |
| **එකතුව** | **148** |

**2014/15 (2016 වර්ෂය සඳහා) අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි සිසුන් ගණන**

| රට | **2014/2015 සිසුන් සංඛ්‍යාව** |
|---|---|
| ඉන්දුනීසියාව | 2 |
| පාකිස්ථානය | 5 |
| මාලදිවයින | 5 |
| නේපාලය | 6 |
| භූතානය | 4 |
| නයිජීරියාව | 2 |
| උගන්ඩාව | 1 |
| කෙන්යාව | 1 |
| **එකතුව** | 26 |

2017/18 අධ්‍යයන වර්ෂයට පූර්ව උපාධි අයදුම්පත් කැඳවීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවියේ දැන්වීම ප්‍රසිද්ධ කිරීම ද විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා තානාපති කාර්යාල වලට දැනුම් දීම ද සිදු කළ අතර මුළු අයදුම්පත් 50 ක් ලැබී ඇත. සුදුසුකම්ලත් අයදුම්කරුවන් තේරීමේ කටයුතු මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදු කළ අතර සුදුසුකම් සපුරන එක් සිසුවෙකුවත් නොමැති බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දන්වන ලදී.

2014/15 අධ්‍යයන වර්ෂය සඳහා ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලත් සිසුන් 23 දෙදෙනෙකු මේ වන විට විශ්වවිද්‍යාල වල ඉගෙනුම ලබමින් සිටී. (පකිස්ථාන ශිෂ්‍යයින් තිදෙනෙකු හැර ගොස් ඇත).

**2014/2015 වර්ෂවල එක් එක් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු කරන සිසුන් සංඛ්‍යාව**

| විශ්වවිද්‍යාලය | **2014/2015** ප්‍රථම උපාධි සිසුන් | **2015/2016** ප්‍රථම උපාධි සිසුන් | **2016/2017** ප්‍රථම උපාධි සිසුන් |
|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 5 | 2 | 2 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 5 | - | - |
| රුහුණු විශ්වවිද්‍යාලය | 1 | - | - |
| කැළණිය විශ්වවිද්‍යාලය | 7 | - | 1 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2 | 5 | 2 |
| යාපනය විශ්වවිද්‍යාලය | 2 | 2 | - |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 1 | 1 | - |
| වයඹ විශ්වවිද්‍යාලය | - | 1 | - |
| රජරට විශ්වවිද්‍යාලය | | | 1 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | - | 1 | 1 |
| වවුනියා මණ්ඩපය | - | 1 | - |
| **එකතුව** | **23** | **13** | **07** |

### 2.6.6. ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලංකාව තුළ පශ්චාද් උපාධි අධ්‍යාපන අවස්ථා තවදුරටත් ලබාදීම සඳහා 2014 වර්ෂයේදී "ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන" පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2014 වර්ෂයේ සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව ප්‍රමාණය පහත පරිදි වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය යන ආයතන වාර්ෂිකව පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

**ලියාපදිංචි මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව**

| අධ්‍යයන වර්ෂය | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 2014 | 02 |
| 2015 | - |
| 2016 | 02 |
| 2017 | 03 |
| 2018 | 02 |
| **එකතුව** | **09** |

ඒ අනුව ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මේ වනවිට ශිෂ්‍යත්වලාභී මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව 09කි. පශ්චාද් උපාධි සාර්ථකව හදාරන ලද සිසුන් තිදෙනෙකු මේ වනවිට තම රටවලට පිටත්ව ගොස් ඇති අතර තවත් සිසුන් දෙදෙනෙකු පාඨමාලා හැරගොස් ඇත. සිසුන් සිව්දෙනෙකු මේ වනවිට පාඨමාලා හදාරමින් සිටී.

2019 අධ්‍යයන වර්ෂය සඳහා පශ්චාද් උපාධි අයදුම්පත් කැඳවීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවියේ දැන්වීම ප්‍රසිද්ධ කිරීම සිදු කළ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය සඳහා අයදුම්පත් 34 ක් ද කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය සඳහා අයදුම්පත් 34 ක් ද ලැබී ඇත. ඒ අතුරින් සුදුසුකම්ලත් සිසුන් දෙදෙනෙකු තෝරා ගෙන ඇති අතර ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමේ කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතී.

## 2.6.7. විදේශ නිවාඩු

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා නිවාඩු අනුමැතිය ලබා දීම - 2018.01.01 සිට 2018.12.31 දක්වා

| විශ්වවිද්‍යාලය/ආයතන | රාජකාරි නිවාඩු | පෞද්ගලික නිවාඩු | එකතුව |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 28 | 16 | 44 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 26 | 5 | 31 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 34 | 16 | 50 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 698 | 295 | 993 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 525 | 225 | 750 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 507 | 167 | 674 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 266 | 158 | 424 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 158 | 165 | 323 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 261 | 84 | 345 |
| යාපනය විශ්වවිද්‍යාලය | 192 | 153 | 345 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 70 | 89 | 159 |
| විවෘත විශ්වවිද්‍යාලය | 159 | 67 | 226 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 121 | 45 | 166 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 41 | 72 | 113 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 96 | 81 | 187 |
| රජරට විශ්වවිද්‍යාලය | 61 | 9 | 70 |
| වයඹ විශ්වවිද්‍යාලය | 62 | 40 | 102 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 45 | 12 | 57 |
| වවුනියා මණ්ඩපය | 6 | 2 | 8 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (GWAI) | 13 | 11 | 24 |
| ස්වාමි විපුලානන්ද ආයතනය | 2 | 11 | 13 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 13 | 3 | 16 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA) | 5 | 0 | 5 |
| ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනය (PGIE) | 2 | 0 | 2 |
| පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය (PIM) | 91 | 1 | 92 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) | 19 | 19 | 38 |
| **එකතුව** | **3,501** | **1,756** | **5,257** |

## 2.6.8 දේශීය අරමුදල් හා උපයාගත් අරමුදල් අනුමැතිය

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා එම ආයතන විසින් උපයන ලද අරමුදල් (Generated Funds) හා දේශිය අරමුදල් සඳහා අනුමැතිය / නිර්දේශ ලබාදීම. 2018.01.01 සිට 2018.12.31 දක්වා

| විශ්වවිද්‍යාලය | අරමුදල් රු:මිලි. (දේශිය/උපයාගත් අරමුදල්) | ගුවන් ටිකට් පත්‍ර |
|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 143 | 08 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 13 | 16 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 258 | 00 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 69 | 12 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 00 | 22 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 00 | 05 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 02 | 00 |
| විවෘත විශ්වවිද්‍යාලය | 64 | 37 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 06 | 05 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 09 | 00 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 23 | 01 |
| රජරට විශ්වවිද්‍යාලය | 27 | 00 |
| වයඹ විශ්වවිද්‍යාලය | 02 | 00 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 06 | 00 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 15 | 00 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 01 | 00 |
| පශ්චාත් උපාධි බෞද්ධ හා පාලි | 04 | 00 |
| පශ්චාත් උපාධි කළමනාකරණ | 25 | 00 |
| **එකතුව** | **667** | **106** |

## 2.6.9 වීසා නිකුත් කිරීම හා දිර්ඝ කිරීම


2017/18 අධ්‍යයන වර්ෂය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල වල උසස් අධ්‍යාපන කටයුතු සඳහා පැමිණෙන විදේශීය සිසුන් වෙනුවෙන් විසා නිකුත් කිරීමේ හා වීසා දීර්ඝ කිරීමේ කටයුතු සඳහා නිර්දේශ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි ලබා දී ඇත. මියන්මාරය, ජර්මනිය, භූතානය, වියට්නාමය හා චීනය ආදී රටවලින් සිසුන් බහුල වශයෙන් අධ්‍යයන කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන අතර වෛද්‍ය විද්‍යාව, කලා උපාධිය හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලා ඔවුන් හදාරන විෂය ක්ෂේත්‍රයන් අතර ජනප්‍රිය විෂය ධාරා වේ.

**වීසා දීර්ඝ කිරීම (උපාධි පාඨමාලා අනුව)**
**2018.01.01 - 2018.12.31 දක්වා**

| විශ්ව විද්‍යාලය | පශ්චාත් උපාධි | ප්‍රථම උපාධි | Internship /Electives | Stu. Exchange | AIE SEC | Diploma | Other Studies /Training | Others | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 34 | 42 | 19 | 10 | 21 | 1 | | 15 | **162** |
| කැලණිය | 32 | 99 | 1 | 5 | | 45 | 17 | 8 | **207** |
| ජයවර්ධනපුර | 05 | 07 | | | 17 | 13 | | | **42** |
| බෞද්ධ හා පාලි | 44 | 88 | | | | 3 | | 2 | **135** |
| මොරටුව | 09 | 13 | 4 | | 5 | | | 2 | **33** |
| රුහුණ | 04 | 02 | 357 | | | | | 1 | **364** |
| රජරට | 04 | 02 | | | | | | | **6** |
| පේරාදෙණිය | 93 | 54 | | 17 | 3 | 1 | 10 | 2 | **180** |
| යාපනය | 00 | 16 | | | | | | | **16** |
| සබරගමුව | 00 | 01 | | | | | | 3 | **4** |
| අග්නිදිග | 00 | 05 | | | | | | | **5** |
| වයඹ | 00 | 01 | | | | | | | **1** |
| ඌවවෙල්ලස්ස | 00 | 04 | | | | | | | **4** |
| නැගෙනහිර | 01 | 02 | | | | | | | **3** |
| විවෘත | 10 | 01 | | | | 1 | 1 | | **13** |
| පශ්චාත් උපාධි බෞ.හා පාලි | 430 | 01 | | | | | | | **431** |
| වෙනත් (SAITM) | 00 | 02 | | | | | | | **2** |
| එකතුව | **666** | **358** | **381** | **32** | **46** | **64** | **28** | **33** | **1,608** |

## 2.7. සැලසුම් අංශය

**සංවිධාන සටහන**



### 2.7.1 සැලසුම් අංශයේ කාර්යභාරය

**01. දේශීය හා විදේශීය ව්‍යාපෘති නියාමනය කිරීම.**

- දේශීය හා විදේශීය ව්‍යාපෘති යෝජනා අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවීම, හා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තුමේන්තුව විසින් එම ව්‍යාපෘතිවලට අදාලව කරනු ලබන විමසීම් සඳහා පිළිතුරු සැපයීම.
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද දේශීය ව්‍යාපෘති පිළිබඳව අදාල ආයතන දැනුවත් කිරීම හා ඒවා ආරම්භ කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලබන විදේශීය ව්‍යාපෘති වලට අදාලව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අවශ්‍ය තොරතුරු ලබාදීම.
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අනුමත කරන ලද විදේශ ව්‍යාපෘති වලට අදාලව ව්‍යාපෘති කලමනාකරන අංශයන් පිහිටුවීමට අදාල කටයුතු සිදු කිරීම.
- විදේශ ව්‍යාපාති වලට අදාලව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.
- විදේශ ව්‍යාපෘති වලට අදාලව අත්සන් කල යුතු MOU අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.
- විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කාර්යයන් ඉටුකිරීම හා ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ගිණුම් අංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම, මෙහෙයුම් කමිටු සමාජිකයින් පත්කිරීම, මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීම හා එම රැස්වීම්වල ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- විදේශීය අරමුදල් ව්‍යාපෘති වල නියාමනය කිරීමට වරින්වර පැමිණෙන විදේශ දූත පිරිස් සමඟ පැවැත්විය යුතු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘතිවල හා විදේශීය ව්‍යාපෘතිවල කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපෘති දත්ත විශ්ලේශණය කිරීම, ගැටළු හඳුනා ගැනීම සහ පසු විපරම් කිරීම.
- අමාත්‍යාංශය සෘජු පාලනය යටතේ පවතින විදේශ ව්‍යාපෘති සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී ඉදිරි වර්ෂයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සලසාදීම .
- විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය හා සම්බන්ධ සියලු කටයුතු සංවිධානය කිරීම සහ වාර්තා පිළියෙල කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දන්වා එවන ලද ව්‍යාපෘතීයන් හී සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- දේශීය හා විදේශීය ව්‍යාපෘතිවලට අදාලව ජනාධිපති ලේකම් කාර්යාලය, ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ආකෘති අනුව කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කර ලබාදීම.

**02. අයවැය වාර්තා පිළියෙල කිරීම හා අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

- වාර්ෂික අයවැය වාර්තාව සකස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ලබා ගැනිම හා එමගින් වාර්ෂික අයවැය වාර්තාව පිළියෙල කිරීම.

- මුදල් අමාත්‍යාංශය සහ අනිකුත් ආයතන අතර අයවැය සාකච්ඡා පැවැත්වීම සංවිධානය කිරීම.
- වාර්ෂික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිලියෙල කිරීම.
- අනුමත වූ වාර්ෂික අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ගිණුම් අංශය සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරිම, ප්‍රගති වාර්තා සකස් කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා එම රැස්වීම්වල දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
- අයවැය යෝජනා ව්‍යාපෘතිවලට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය, ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ආකෘති අනුව කාර්තුමය ප්‍රගති වාර්තා පිලියෙල කර ලබාදීම.

**03. අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව හා වාර්ෂික කාර්යයසාධන වාර්තාව පිළියෙල කිරිම**

උසස් අධ්‍යාපන අංශය විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු ප්‍රගති සමාලෝචන වාර්තාව හා වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.

**04. ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සැකසීම හා අධීක්ෂණය**

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා උපාය මාර්ගීක සැලැස්ම යාවත්කාලීන කිරිම.
- අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන වල ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සකස් කිරීම අධීක්ෂණය, නියාමනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම.
- පවරන ලද ජාතික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී අමාත්‍යාංශය නියෝජනය කරමින් දායකත්වය ලබාදීම.

**05. විවිධ ආයතන විසින් වරින්වර ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම**

- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්ෂිකව ලබා දිය යුතු වාර්තා සකස් කිරීම.
- ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතු තොරතුරු කලානුරූපීව ලබා දීම.
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා සකස් කිරීමට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල දත්ත ලබා දීම.
- රජයේ විවිධ ආයතන විසින් හා අමාත්‍යාංශ මඟින් වරින්වර ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම.

**06. දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා පවත්වාගෙන යාම**

- ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම හා දත්ත පද්ධති පවත්වාගෙන යාම විශ්ලේෂණය කිරීම.
- අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම සහ වාර්තා පිළියෙල කිරීම
- විශ්වවිද්‍යාල හා අනුබද්ධ ආයතන වලට වාර්ෂිකව අවශ්‍ය තොරතුරු තාක්ෂණික පද්ධති, මෙවලම් හා Wi-Fi පහසුකම් වලට අදාළ තොරතුරු වාර්ෂිකව යාවත්කාලීන කිරීම හා දත්ත පද්ධතිය පවත්වාගෙන යාම.

**07. අනෙකුත් කාර්යයන්**

- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව පර්යේෂණ යෝජනා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම
- මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට අවශ්‍ය දත්ත ලබා දිම

- දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත ලබා දීම.
- Economic Policy Statement වලට අදාළ ප්‍රගති වාර්තා සකස් කිරීම.
- තිරසර සංවර්ධන අරමුණු සඳහා වන සැලැස්ම සකස් කිරීමට දායකත්වය ලබා දීම.
- ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සහ සේවා ප්‍රතිපත්ති සැලැස්ම සකස් කිරීමට දායකත්වය ලබා දීම.
- යුනෙස්කෝ ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදීම.

**2.7.2 සැලසුම් අංශය 2018.01.01 සිට 2018.12.31 දක්වා කරන ලද කාර්යයන්.**

- දේශීය විදේශීය ව්‍යාපෘති වලට අදාලව 2018 වර්ෂයේ කාර්තු හතර සඳහා කාර්තු ප්‍රගති වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයට හා ව්‍යාපාති මෙහෙයුම් හා කළමනාකරණ දෙපාර්තුමේන්තුවට ලබාදීම.
- 2018 වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

| ව්‍යාපෘතිය/ආයතනය | ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන |
|---|---|
| අයවැය යෝජනා ව්‍යාපෘති | 15 |
| විදේශ ව්‍යාපෘති | 18 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 1 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 1 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 1 |

- විදේශීය ව්‍යාපෘතිවලට අදාලව ව්‍යාපෘති කලමනාකරණ අංශයන් පහත පරිදි පිහිටුවා ඇත.

| ව්‍යාපෘතිය | නිලධාරීන් ගණන |
|---|---|
| වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 12 |
| කැලණිය, සබරගමුව, රජරට හා කොළඹ විශ්වවිද්‍යාල සඳහා විද්‍යා තාක්ෂණ සම්පත් සංවර්ධන වැඩසටහන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය (ADB) | 22 |
| උසස් අධ්‍යාපන සහ පර්යේෂණ සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (World Bank) | 33 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගලි සංකීර්ණය ඉදිකිරීම | 14 |
| කිලිනොච්චිය- යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨය සඳහා පර්යේෂණ හා පුහුණු සංකීර්ණය ඉදිකිරීම | 8 |

- 2018 වර්ෂයේදී විදේශ ව්‍යාපෘතිවලට අදාලව පහත පරිදි මෙහෙයුම් කමිටු සාමාජිකයන් පත්කර ඇත.

| ව්‍යාපෘතියේ නම | සාමාජිකයන් |
|---|---|
| වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 12 |
| කැලණිය, සබරගමුව, රජරට හා කොළඹ වි.වි සඳහා විද්‍යා තාක්ෂණ සම්පත් සංවර්ධන වැඩසටහන සහ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය (ADB) | 18 |
| නැගෙනහිර වි.වි සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 12 |
| උසස් අධ්‍යාපන සහ පර්යේෂණ සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (World Bank) | 11 |


- 2018 වර්ෂයේදී විදේශීය ව්‍යාපෘතිවලට අදාල මෙහෙයුම් කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

| ව්‍යාපෘතිය | මෙහෙයුම් කමිටු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| කැලණිය, සබරගමුව, රජරට හා කොළඹ විශ්වවිද්‍යාල සඳහා විද්‍යා තාක්ෂණ සම්පත් සංවර්ධන වැඩසටහන සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය (ADB) | 2 |
| කිලිනොච්චිය- යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨය සඳහා පර්යේෂණ හා පුහුණු සංකීර්ණය ඉදිකිරීම | 2 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගලි සංකීර්ණය ඉදිකිරීම | 6 |
| උසස් අධ්‍යාපන සහ පර්යේෂණ සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (World Bank) | 1 |

- 2017 වර්ෂයේ අනුමත කරන ලද 2018 වර්ෂයේ දී ද ප්‍රතිපාදන ලබා දුන් අයවැය යෝජනා 7ක් හා 2018 වර්ෂයේ අනුමත වූ අයවැය යෝජනා 7ක් ක්‍රියාත්මක කරන ලදී.
- 2018 වර්ෂයේ විදේශීය ව්‍යාපෘති 22ක් සැලසුම් අංශය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලදී.
- අයවැය යෝජනා වලට අදාලව මාසික ප්‍රගති වාර්තා ජාතික අයවැය දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත.
- 2017 වාර්ෂික වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ලබා දී ඇත.
- 2018 වර්ෂයේ මහ බැංකු වාර්තාව සකස් කිරීම සඳහා උසස් අධ්‍යාපන අංශයේ වාර්තාව සකස්කර මහබැංකුව වෙත ලබා දෙන ලදී.
- 2018 ක්‍රියාකාරී සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මේ කාර්තු ප්‍රගති වාර්තා රාජ්‍ය විගණන දෙපාර්තුමේන්තුවට හා අභ්‍යන්තර විගණන අංශයට ලබා දීම.
- මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ මාසික ප්‍රගති වාර්තාව සකස්කර විදේශ රැකියා අමාත්‍යාංශයට, විදේශ කටයුතු අමාත්‍යාංශයට, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීම් සුභසාධන හා කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම පුනරුත්තාපන උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදීම.
- විගණන විමසීම් 14ක් සඳහා පිලිතුරු සපයා ඇත.

## 2.8 අභ්‍යන්තර විගණන අංශය

**සංවිධාන සටහන**




### 2.8.1 අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය භාරය:-

**1. විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම**

ලේකම්ගේ සභාපතිත්වයෙන් සෑම කාර්තුවකටම වරක් විගණන කළමනාකරණ කමිටු රැස්වීම පවත්වනු ලබයි. මෙම වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පවත්වා ඇත. එම කමිටු රැස්වීම්වලදී පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය වූ අතර ඒවාට අවශ්‍යකරනු ලබන විසඳුම් හා යෝජනාද එහිදී ගනු ලැබුණි.

i. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වත්කම් ලේඛණවල ඇතුලත් කර ඇති ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම, මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී ඇති වී ඇති ගැටළු සහගත තත්වයන් හා භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම යනාදී කරුණු.

ii. විගණකාධිපති වාර්තා මගින් පැන නැඟී ඇති කරුණු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.

iii. අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීම.

iv. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ව්‍යාපෘතිවල වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳව සමාලෝචනය කිරීම.

v. ප්‍රාග්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම

vi. විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන විසින් විගණන හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය විමර්ෂණය කිරීම.

vii ගිණුම් කාරක සභාවේදි සාකච්ඡාවට බඳුන් වූ කරුණු පිලිබඳ සාකච්ඡා කිරීම හා ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කිරීම.

2. **මූල්‍ය කළමණාකරනය**

මේ යටතේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය, එහි ශක්තිමත්භාවය පරීක්ෂා කිරීම, අත්තිකාරම් B ගිණුම පරීක්ෂාව හා මාසික ගිණුම් පරීක්ෂාවන් සිදු කිරීම , වවුචර් පරීක්ෂාවන් , බැංකු සැසඳුම් ප්‍රකාශයන් පරීක්ෂාව යන කාර්යයන් සිදු කරන ලදී.

3. **වත්කම් කළමණාකරනය**

වත්කම් පාලනය සඳහා යොදා ඇති පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව පරීක්ෂාව , වත්කම් ලේඛණවල නිවරදිතාවය පරීක්ෂාව , භාණ්ඩ සමීක්ෂණ කටයුතු පරීක්ෂාවන් හා භාණ්ඩ සමීක්ෂණයේදී දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම යනාදිය සිදු කරන ලදී.

4. **ප්‍රවාහන කළමණාකරනය**

වාහන නඩත්තු ලේඛණ පවත්වාගෙන යාමේ නිවරදිතාවය පරීක්ෂාව , ඉන්ධන පරිභෝජනය පිලිබද පරීක්ෂාව හා අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඵලදායීත්වය යන පරීක්ෂාවන් සිදු කිරීම.

5. **ප්‍රසම්පාදන කළමණාකරනය**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු වී ඇතිදැයි පරීක්ෂාව, ප්‍රසම්පාදන කටයුතුවල විනිවිදභාවයන් පරීක්ෂාව හා ඒ සම්බන්ධයෙන් හුවමාරු වන ලිපි ලේඛණයන් පරීක්ෂාව

**2.8.2 2018.01.01 සිට 2018.12.31 කාලය තුලදී අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරන ලද කාර්ය භාරය:-**

1. **ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

ව්‍යවස්ථානුකූලව හා අනෙකුත් අදාල වාර්තාවන්ට අනුව කටයුතු සිදුවන්නේදැයි සොයා බැලීම, අභ්‍යන්තර විගණන කටයුතු පිලිබදව අධීක්ෂණය හා මග පෙන්වීම , විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම , විශේෂ විමර්ෂණයන් සිදු කිරීම හා විගණන විමසුම් වලට පිලිතුරු දීම සම්බන්ධයෙන් සොයා බැලීම

2. **ප්‍රාග්ධන ව්‍යාපෘති**

ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඇගයීම , ගිණුම්කරණයන්හි නිවරදිතාවය පරීක්ෂා කිරීම, මූල්‍ය වාර්තා හා අනෙකුත් වාර්තාවන්හි නිවරදිතාවය හා ඒවා නියමිත වේලාවට සකස් කරන්නේදැයි පරීක්ෂාව , රජයේ ප්‍රතිපත්ති හා නීති රීතිවලට අනුව කටයුතු සිදුවන්නේදැයි සොයා බැලීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශනය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුවන්නේදැයි පරීක්ෂා කිරීම

**3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ඒ යටතේ ඇති විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන**


ඉහත ආයතනයන්හි අභ්‍යන්තර විගණනයේ ඵලදායීත්වය ඇගයීම, මූල්‍ය වාර්තා හා අනෙකුත් වාර්තාවන්හි නිවරදිතාවය හා ඒවා නියමිත වේලාවට සකස් කරන්නේදැයි පරීක්ෂාව, විශේෂ විමර්ෂණ සිදු කිරීම, විගණකාධිපති වාර්තා හා COPE වාර්තා මගින් දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මකවී ඇත්දැයි සොයා බැලීම හා ගතයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දීම , විගණන විමසුම් සඳහා පිලිතුරු ලබාදීමේ ක්‍රියාවලිය පරීක්ෂාවන් යනාදිය සිදු කිරීම

**4. විශේෂ විමර්ෂණ**

ඉහත කටයුතුවලට අමතරව හඳුනා ගත් ගැටළු සහගත සිද්ධීන් සම්බන්ධයෙන් විශේෂ විමර්ෂණයන් සිදු කොට විගණන විමසුම් ඉදිරිපත් කිරීම හා තෝරාගනු ලැබූ විශ්වවිද්‍යාල කිහිපයක බැංකු සැසඳුම් පරීක්ෂාව , අත්තිකාරම් පරීක්ෂාව , ගිණුම් පරීක්ෂාව හා පෙත්සම් විභාග කිරීම

## 2.9 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

**සංවිධාන සටහන**



උසස් අධ්‍යාපනය පිළිබඳ පවතින ධනාත්මක ආකල්ප දිනෙන් දින වර්ධනය වන පසුබිමක් තුල සිසුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා වාර්ෂිකව ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය තුල පවතින අවස්ථා ඉහල නැංවීම අපහසු කරුණක්ව පවති. ඒබැවින් ඒ සඳහා විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුලින් අධ්‍යයන අවස්ථා සැපයීමේ සාපේක්ෂ වැදගත්කම සලකා ඒම ක්ෙෂ්ත්‍ර වර්ධනය කිරිමත්, නියාමනය කිරීමත් සෘජුවම ෙමම අමාත්‍යාංශය යටතට ගනු ලැබූ අතර, ඒ සඳහා රාජ්‍ය ෙනාවන උසස් අධ්‍යාපන අංශය 2013 ජනවාරි මස ස්ථාපිත කරන ලදි.

තවද, ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 25 ඒ වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ගරු උසස් අධ්‍යාපන අමාත්‍ය තුමා විසින් උපාධි ප්‍රදානය කිරීමේ අවසරය ඉල්ලා සිටින උසස් අධ්‍යාපන ආයතන සඳහා අවසරය දීමේ කටයුතු සඳහා නිශ්චිත බලධාරියා වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කර ඇති අතර නිශ්චිත බලධාරියා විසින් පවරන උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබාදීමේ ලද කටයුතුද දැනට මෙම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය ක්‍රියාත්මක කරමින් පවතී.

**2.9.1 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ කාර්යභාරය**

I. කාලානුරූපීව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධව පවතින ප්‍රතිපත්ති, නිතිරීති,රෙගුලාසි යාවත්කාලීන කිරීම.

II. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අදාලව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

III. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අවස්ථා පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. විදේශ උසස් අධ්‍යාපන ආයතන මඟින් සහතික පිරිනමනු ලැබීම පිණිස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය යටතේ ලියාපදිංචි නොවූ දේශීය උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වාගෙන යන පාඨමාලා සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

V. උසස් අධ්යාපන අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදාන අනුමැතිය ලබා දෙන ලද රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල විදේශ සිසුන්ගේ වීසා අයදුම්පත් නිර්දේශ කිරීම සම්බන්ධ කටයුතු ඉටු කිරීම හා නව ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.

**2.9.2 නිශ්චිත බලධරයාගේ කාර්යය ඉටුකිරීම.**

1. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන නියාමනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති,නීතිමය රාමුව හා රීතීන් සැකසීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
2. ප්‍රතීතනය හා තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම් සංවිධානය කිරීම, පැවැත්වීම හා ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
3. උපාධි පිරිනැමීම සඳහා වූ අනුමැතිය ඉල්ලා ආයතන විසින් එවා ඇති අයදුම්පත්වල සුදුසුකම් සනාථ කර ගැනීම.
4. උපාධි පිරිනැමීම සඳහා වූ අනුමැතිය ඉල්ලා එවා ඇති අයදුම්පත් ඉදිරිපත් කරන ලද ආයතනවල සමාලෝචන කටයුතු සඳහා සමාලෝචන කමිටු පත් කිරීම, සමාලෝචනය කිරීම හා ඇගයීම් සිදුකිරීම හා සුදුසුකම් සපුරාලන ආයතන සඳහා උපාධි පිරිනැමීම සඳහා වූ අනුමැතිය ලබා දීම.

5. උපාධි පිරිනැමීමට අනුමැතිය ලැබූ ආයතනවල විස්තර හා ඒවායේ කටයුතු පිළිබඳව තොරතුරු පවත්වා ගෙනයාම හා පසු විපරම් කටයුතු හා යාවත්කාලීන කිරීම හා වාර්තාකරණය.
6. උපාධි ප්‍රදාන අනුමැතිය ලද, වසර 05 ක් සපුරා ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන නැවත ඇගයීම් සිදුකිරීම හා පනතේ සඳහන් උපාධි ප්‍රදාන ආයතන පිලිපැදිය යුතු වෙනත් අවශ්‍යතා එම ආයතන විසින් ඉටු කර ඇති බවට සහතික වීම.

### 2.9.3 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් 2018-01-01 දින සිට 2018-12-31දින දක්වා ශ්‍රී ලකාවේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්.

**1. තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා ගැනීම**

ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන සියළු උසස් අධ්‍යාපන ආයතනයන්හි පවත්වාගෙන යනු ලබන උසස් අධ්‍යාපන පාඨමාලාවන් නියාමනය කිරීමේ හා තත්ත්ව ආරක්ෂණය කිරීමේ කාලීන අවශ්‍යතාවය මත තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සියලු පාර්ශවයන් සමඟ සාකච්ඡා පවත්වා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යොමු කර ඇත.

**2. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම.**

උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම අරමුණු කර ගනිමින් එම ආයතන වල පාඨමාලාවන්, ශිෂ්‍යයින් පිළිබඳ විස්තර ඇතුලත් කර මෙම අංශය මඟින් තොරතුරු පවත්වාගෙන යාම හා පසු විපරම් කටයුතු හා එහි යාවත්කාලීන කිරීම 2018 වර්ෂයේදී ද සිදු කර ඇත.

2018.12.31දිනට උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතන වල සිසුන් පිළිබඳ විස්තර

| s/n | උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගත්ආයතනයේ නම | උපාධි ප්‍රදානය කිරීමේ බලතල පිළිගත් පාඨමාලා සඳහාසිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | වාර්ෂික සිසුන් බඳවා ගැනීම-2018 | *මුළු සිසුන් | සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් |
| 1 | ඉන්ස්ටිටියුට්ඔෆ් ස්වෙයින්ග් ඇන්ඩ් මැපියින්(ISM) | 14 | 14 | 0 |
| 2 | ශ්‍රිලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) | 2000 | 5852 | 1743 |
| 3 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඩිවොලොප්මන්ට් ඇඩ්මිනිස්ට්‍රේෂන් (SLIDA) | 85 | 160 | 0 |
| 4 | නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් සෝසල් ඩිවොලොප්මන්ට් (NISD) | 124 | 368 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 5 | ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන් (Acquinas) | 259 | 381 | 91 |
| 6 | සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් (SAITM) | 2018 වර්ෂය තුල සිසුන් බඳවා ගෙන නොමැත. | | |
| 7 | නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් (NSBM) | 850 | 1972 | 158 |
| 8 | කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්)ලිමිටඩ් (CINEC) | 381 | 736 | 27 |
| 9 | ශ්‍රී ලංකා ඉන්ටනැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA) | 157 | 371 | 55 |
| 10 | ද ඉන්ස්ටිටියුට් ඔෆ් චාටඩ් එකවුන්ටන්ට්ස්ඔෆ්ශ්‍රී ලංකා (ICA -SL) | 355 | 933 | 131 |
| 11 | සණස කැම්පස් ලිමිටඩ් (Sanasa) | 15 | 164 | 0 |
| 12 | හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (Horizon Campus) | 621 | 766 | 28 |
| 13 | සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික)සමාගම (KAATSU) | 1130 | 1999 | 94 |
| 14 | නාගානන්ද ඉන්ටනැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 138 | 260 | 80 |
| 15 | එස්.එල්.ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 186 | 404 | 0 |
| 16 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් (SLINTEC) | 7 | 21 | 0 |
| 17 | සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Saegis Campus) | පාඨමාලා 2019 මාර්තු සිට ආරම්භ වීමට නියමිතව ඇත. | | |
| | මුළු ගණන | **6322** | **14401** | **2507** |

සටහන

***** - 2018.12.31 දිනට උපාධි පාඨමාලාව හදාරමින් සිටින මුළු සිසුන් සංඛ්‍යාව (උදා - අවු.03 ක උපාධි පාඨමාලාවක මුළු සිසුන් ගණන වනුයේ පෙර වර්ෂ වලදී සහ 2018 වර්ෂයේදී බඳවා ගනු ලැබූ සිසුන්ගෙන් 2018.12.31 දිනට එම පාඨමාලාව හදාරමින් සිටින සිසුන්ගේ එකතුවයි.)

### 3. උපාධි ප්‍රධාන ආයතනයක් ලෙස පිළිගෙන වර්ෂ 05 සම්පූර්ණ කරන ලද ආයතන හා උපාධි ප්‍රදාන බලය ලබාගත් උපාධි පාඨමාලා නැවත ඇගයීම

නිශ්චිත බලධරයා විසින් පිළිගත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතන / උපාධි පාඨමාලාවන් නැවත ඇගයීමේ / සමාලෝචනය කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණු අතර ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කොට ගරු අමාත්‍ය

මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව සෑම ආයතනයක්ම / උපාධි පාඨමාලාවක්ම වසර 5කට වරක් ඇගයීම / සමාලෝචනය කිරීම සිදු කළ යුතුය.

### 4. දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම

උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතන සහ ඒ සඳහා නව අයදුම්පත් ඉදිරිපත් කර ඇති උසස් අධ්‍යාපන ආයතන සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේද අනුග්‍රහය මත 2018.08. 02 දින වැඩමුළුවක් සංවිධානය කරන ලදී. එහිදී උසස් අධ්‍යාපන ආයතනයේ සහ පිරිනමනු ලබන පාඨමාලාවල ගුණාත්මක භාවය පවත්වා ගැනීම සහ එහි වැදගත්කම පිළිබඳව සාකච්ඡා කෙරුණි.

### 5. ආයතන / පාඨමාලා සමාලෝචකයින් පුහුණු කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම

උසස් අධ්‍යාපන ආයතන උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස පිළිගැනීම සඳහා ලබා දෙන අයදුම්පත් සමාලෝචන කාර්යයෙහි නියැලෙන සහ නියැලීමට කැමති විවිධ විෂයයන් සඳහා ප්‍රවීණ විද්වත් පුද්ගලයින් සඳහා ආයතනික සහ විෂය සමාලෝචනය පිළිබඳව දැනුම තවදුරටත් වර්ධනය කිරීම අරමුණු කරගෙන 2018.11.15 දින වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

### 6. ආයතන / උපාධි පාඨමාලා සමාලෝචකයින්ගේ සංචිතයක් පවත්වා ගෙන යාම.

උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබා දීමේ ක්‍රියාවලියෙහි අයදුම්පත් ආයතන / පාඨමාලා සමාලෝචනය සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි සහ රාජ්‍ය / පෞද්ගලික අංශයේ විෂය ක්ෂේත්‍ර ප්‍රවීනයන්ගේ සේවය නිරන්තරයෙන් ලබාගැනීම සිදු කරයි. මෙම සමාලෝචන කාර්යය සඳහා විෂය ක්ෂේත්‍ර ප්‍රවීනයන් යොදාගැනීම විධිමත් කිරීම සඳහා ජාතික පුවත්පත් මඟින් එම කාර්යයට කැමැත්ත ඇඟයීමේ අයදුම්පත් කැඳවීම සිදු කරන ලද අතර ඒ සඳහා විෂය ක්ෂේත්‍ර ප්‍රවීනයන් 80 දෙනෙකු සිය කැමැත්ත අඟවන ලදී.

### 7. පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයන්හි පාඨමාලා සඳහා ශිෂ්‍ය ධාරිතාවය නිර්ණය කිරීම.

අයවැය යෝජනාවක් යටතේ ක්‍රියාත්මක පොලී රහිත ශිෂ්‍ය ණය වැඩසටහනට ඇතුලත් සියළු පාඨමාලා සඳහා ශිෂ්‍ය ධාරිතාවය නිර්ණය කිරීම සඳහා විෂය ක්ෂේත්‍ර නිපුණයන්ගෙන් ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්ගෙන් සහ අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් ආයතන පරීක්ෂාවක් සිදු කර ශිෂ්‍ය ධාරිතාවය නිර්ණය කිරීම කරන ලදී.

## 2.9.4 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් 2018-01-01 දින සිට 2018-12-31දින දක්වා නිශ්චිත බලධරයාගේ කාර්යභාරය යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

### 8. ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව පැවැත්වීම

නිශ්චිත බලධරයා වෙත උසස් අධ්‍යාපන ආයතන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස උපාධි ප්‍රදානය කිරීමේ බලය සඳහා නිර්දේශ කිරීම පිණිස විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් සමන්විතව පිහිටවූ "ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව"2018-01-01 දින සිට 2018-12-31දින දක්වා දක්වා රැස්වීම් වාර **12**ක් පවත්වා ඇත. එම රැස්වීම් වාරයන්හි ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.

## 9. 2018 වර්ෂය තුල උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබාදුන් ආයතන හා නව අයඳුම්පත්

2018 දෙසැම්බර් 31 දිනට මේ වන තෙක් ආයතන 17 ක් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇත. තවද මේ කාලයතුල උපාධි පාඨමාලා122 ක් සඳහා උපාධි ප්‍රදානය කිරීමේ බලය පිරිනමා ඇත. එම උපාධි පාඨමාලා 122න් පාඨමාලා 23ක් 2018 වර්ෂය තුලදී උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබා දී ඇත.

උපාධි පාඨමාලා ගණන (2018.12.31 දිනට)

| | ප්‍රථම උපාධිය | පශ්චාත් ඩිප්ලෝමා | ශාස්ත්‍රපති/ විද්‍යාපති | දර්ශනශූරි | දර්ශනපති | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2018.01.01දක්වා | 60 | 12 | 09 | 10 | 08 | **99** |
| 2018.01.01සිට 2018.12.31 දක්වා | 22 | - | 01 | - | - | **23** |
| **මුළු ගණන** | **82** | **12** | **10** | **10** | **08** | **122** |

## 10. නව අයඳුම්පත් සඳහා සමාලෝචනයන්

දැනටමත් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතන **17**ට අමතරව නව ආයතන **16**කින් උපාධි ප්‍රදාන කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම සහ උපාධි ප්‍රදානය කිරීමේ බලය සඳහා අයඳුම් කර ඇත. දැනට සිදු කරමින් පවතින ආයතනික සමාලෝචන පහත පරිදි වේ.

නව අයඳුම්කාර ආයතනවල සමාලෝචනයන් පිළිබඳ විස්තර

| | |
|---|---|
| (1) නලීමියා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉස්ලැමික් ස්ටඩීස් සොසයිටි (ඉන්කෝපරේෂන්) | ආයතනික සමාලෝචනය සම්පූර්ණ කර ඇත. විෂය සමාලෝචනය සඳහා අයඳුම්පත් එවීමට නියමිතව ඇත. |
| (2) ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් | |
| (3) ඊ සොෆ්ට් මෙට්රො කැම්පස් | ආයතනික සමාලෝචනය විෂය සමාලෝචනය සිදුකෙරෙමින් පවතී. |
| (4) බැටිකොලෝ කැම්පස් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (5) එඩියුලින්ක් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් | ආයතනික සමාලෝචනය සිදුකෙරෙමින් පවතී. |
| (6) කොලොම්බු ස්කූල් ඔෆ් කන්ස්ට්‍රක්ෂන් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | |
| (7) ඔස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | |
| (8) ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හෙල්ත් සයන්ස් ලිමිටඩ් | |
| (9) රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කොලම්බු ප්‍රයිවට් ලිමිටඩ් | |
| (10) බ්‍රිටිෂ් කොලේජ් ඔෆ් ඇප්ලයිඩ් ස්ටඩීස් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (11) ලංකා නිපෝන් බිස්ටෙක් ඉන්ස්ටිටියුට් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (12) ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් | |
| (13) බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් ප්‍රයිවට් ලිමිටඩ් | 2018 වර්ෂයේදී ලද නව අයඳුම්පත් |
| (14) ඉන්ෆොමැටික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ් | |
| (15) බෙනඩික්ට් කැතොලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් ප්‍රයිවට් ලිමිටඩ් | |
| (16) සසෙකස් එඩියුකේෂනල් සර්විසස් ලිමිටඩ් | |

11. තවද, දැනටමත් උපාධි ප්‍රදානයකිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇති ආයතන අතුරින් **12**ක් තවත් නව උපාධි පාඨමාලා සඳහා උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබාගැනීම සඳහා අයදුම් කර ඇත. ඒ අනුව, ආසන්න වශයෙන් නව උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් **66**ක් විෂය සමාලෝචන ක්‍රියාවලියෙහි පවතී.

(1) ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT)
(2) ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයස්ට් ස්ටඩීස් (Aquinas)
(3) සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජී ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් (SAITM)
(4) නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් (NSBM)
(5) කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් (CINEC)
(6) හොරයිසන් කොලේජ් ඕෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (Horizon Campus)
(7) සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම(KAATSU)
(8) නාගානන්ද ඉන්ටනැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(9) එස්.එල්.ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (SLTC)
(10)ශ්‍රී ලංකා ඉන්ටනැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA)
(11)ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝටෙක්නොලජි (ප්‍රයිවට්) ලිමිටඩ් (SLINTEC)
(12) සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Saegis Campus)

**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් 2017 දී අයවැය යෝජනා යටතේ අනුමත වූ පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.**

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍යයන් හට උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි කිරීමේ අරමුණින් පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාල පනත යටතේ අනුමත කරන ලද රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයකින් මෙම ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පිරිනමනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීමට බලාපොරොත්තු වන රජයේ විශ්වවිද්‍යාලයකට ඇතුලත් වීමේ අවකාශ නොලැබූ ශිෂ්‍යයන් සඳහා, එසේ හදාරනු ලබන සම්පූර්ණ පාඨමාලාව වෙනුවෙන් රු. 800,000ක උපරිම ණය මුදලක් ලබා දෙනු ඇත.

මෙම වැඩසටහනේ පළමු අදියර යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන හයක (06) උපාධි පාඨමාලා විසි හයක් (26) හැදෑරීම සඳහා සිසුන් 266 කට අවස්ථාව හිමි විය.

දෙවන අදියර යටතේ 2016 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) ප්‍රවේශය මත සිසුන් 1380ක් ඇතුළත් කළ අතර තවත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දෙකක් ශිෂ්‍ය ණය වැඩසටහන සඳහා ඇතුලත් වූ අතර ඒ අනුව දෙවන අදියරේදී රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල අටක (08) උපාධි පාඨමාලා තිස් අටක් (38) හැදෑරීමට ශිෂ්‍යයන් හට අවස්ථාව හිමි විය.

ලංකා බැංකුව මගින් ණය මුදල් ලබා දීමේ කටයුතු සිදු කරනු ලබන අතර 2018 වර්ෂයේදී සිසුන් 1277 දෙනෙකු සඳහා රු. මිලියන 1145.4 ක ණය මුදල් අනුමත කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේදී පළමු හා දෙවන කණ්ඩායම් සඳහා පාඨමාලා ගාස්තු වශයෙන් රු. මිලියන 296.75 ක මුදලක් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත ගෙවා ඇත. මෙම ණය මුදල් වල පොලිය වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු. මිලියන 12.44 ක් 2018 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුව වෙත ගෙවා ඇත.

2018 ජුලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිසුන්ගේ කැමැත්ත පරිදි මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකුගේ සාමාන්‍ය වියදම් පියවා ගැනීමට වසරකට රු. 75,000/= බැගින් වන ශිෂ්‍යාධාර ණය මුදලක් පොලි රහිත ශිෂ්‍ය ණය මුදලක් ලෙස ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර, ඒ සඳහා සිසුන් 838 දෙනෙකු අයදුම් කල අතර දැනට එම සිසුන් කාර්තුමය වශයෙන් ශිෂ්‍යාධාර මුදල් ලබා ගනී.

ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය නව වැඩසටහනක් වශයෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙත හඳුන්වා දීමේදී ඒ පිළිබඳ ප්‍රචාරණය අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් වේ. ඒ අනුව ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රචාරණ කටයුතු රාජ්‍ය පුවත්පත්, ගුවන් විදුලි වැඩසටහන්, රූපවාහිනී ප්‍රවෘත්ති විකාශය අතරතුර චලනමය පුවත් තීරුවෙහි (Newsline) පළ කිරීම, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවිය, අ.පො.ස (උ.පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් හට විද්‍යුත් පණිවිඩ (email) යැවීම සහ සියළුම දුරකථන ජාලයන් ඔස්සේ කෙටි පණිවිඩ යැවීම ආදී ක්‍රමවේදයන් භාවිතයෙන් සිදු කරන ලදී. මීට අමතරව ජාතික පාසැල් 353ක විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් මාලාවක් 2018 ජූනි මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. එසේම ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය පිළිබඳ අත් පොතක් සකස් කර ඇති අතර මේ වන විට එම අත් පොත භාෂා ත්‍රිත්වයට පරිවර්තනය කර අමාත්‍යංශ වෙබ් අඩවියෙහි පළ කර ඇත.

ශිෂ්‍ය ණය යෝජනා වැඩ සටහනේ සාර්ථකත්වය පිළිබඳ පසු විපරම් කටයුතු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශයේ කාර්යය මණ්ඩලය විසින් 2018 ජුලි - අගෝස්තු කාලය තුළ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත ගොස් සිදු කල අතර ඒ පිළිබඳ සකස් කල වාර්තාව එම ආයතන වලට ලබාදෙන ලදී. එ් අනුව ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයට සම්බන්ධ සිසු සිසුවියන් මුහුණපාන ගැටලු පිළිබඳව සොයා බලා ඒ අනුව අදාල ආයතන සමඟ සාකච්ඡා කර එම ගැටළු සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කරන ලදී.

මීට අමතරව පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් වන්නේ දැයි විමසුම සඳහා මෙහෙයුම් සහ ඇගයුම් කටයුතු වෙනුවෙන් පරිගණක දත්ත පද්ධතියක්ද සකස් කරමින් පවතී.

## 03. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය.

2018 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා උපයෝජනය පහත පරිදි වේ.

| ආයතනය | | පුනරාවර්ථන වියදම (රු.මි.) | | | ප්‍රාග්ධන වියදම (රු.මි.) | | | මුළු වියදම (රු.මි.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන මුදල | වියදම | % | ප්‍රතිපාදන මුදල | වියදම | % | ප්‍රතිපාදන මුදල | වියදම | % |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම | | **36,785** | **36,785** | **100** | **17,624** | **13,804** | **78** | **54,409** | **50,589** | **93** |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | **1,492** | **1,490** | **100** | **7575** | **7416** | **98** | **9067** | **8907** | **98** |
| විදේශීය | | | | | **5189** | **2483** | **48** | **5189** | **2483** | **48** |
| අයවැය යෝජනා | උ.අ.අ. | **363** | **17** | **5** | **1,534** | **437** | **28** | **1,897** | **454** | **24** |
| | වි.ප්‍ර.කො. | **-** | **-** | **-** | **1830** | **1024** | **56** | **1830** | **1024** | **56** |
| මුළු ප්‍රතිපාදන | | **38,640** | **38,276** | **99** | **33,752** | **24,164** | **76** | **72,392** | **63,457** | **88** |

2018 වර්ෂයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන් වූ මුළු ප්‍රාග්ධන වියදමින් 57% ක් ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් වූ අතර 2016 වර්ෂයේ එය 61% ක් විය. 2018 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් වූ ප්‍රතිපාදන යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 116,749 වූ ව්‍යාපෘති 169 ක් ඇතුළත් වූ අතර 2017 වර්ෂයේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 73,965 යටතේ ව්‍යාපෘති 174ක් ක්‍රියාත්මක විය.

2017 වර්ෂයේ හා 2018 වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් වූ ආකාරය පිළිබඳ විග්‍රහයක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශීය වැය ශීර්ෂය යටතේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ පහතින් දක්වා ඇත.

| විශ්වවිද්‍යාලය/ ආයතනය | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන | වියදම | % | ව්‍යා. සංඛ්‍යාව | ප්‍රතිපාදන | වියදම | % |
| භික්ෂු | 09 | 162 | 147 | 91 | 05 | 152 | 132 | 87 |
| බෞද්ධ හා පාලි | 05 | 29 | 4 | 14 | 03 | 77 | 77 | 100 |
| උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 08 | 483 | 483 | 100 | 11 | 200 | 200 | 100 |
| විදේශීය/දේශීය ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති | 07 | 1,310 | 619 | 47 | 10 | 3,556 | 1,174 | 33 |
| අයවැය යෝජනා ව්‍යාපෘති | 01 | 500 | -* | - | 06 | 1,442 | 270 | 21 |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය | 01 | 3,500 | 3,474 | 99 | 01 | 2,044 | 2,044 | 100 |
| එකතුව | **31** | 5,984 | **4,727** | **79** | 36 | 7,471 | 3,897 | 53 |

* **ගෙවීම් කිරීම සඳහා අක්මුදල් නොතිබීම**

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් වැය ශීර්ෂය යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන**

| විශ්වවිද්‍යාලය/ ආයතනය | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යා.සංඛ්‍යා | ප්‍රතිපාදන | වියදම | % | ව්‍යා.සංඛ්‍යා | ප්‍රතිපාදන | වියදම | % |
| පේරාදෙණිය | 19 | 428 | 428 | 100 | 18 | 535 | 535 | 100 |
| කොළඹ | 05 | 391 | 391 | 100 | 04 | 815 | 768 | 94 |
| ජයවර්ධනපුර | 06 | 241 | 131 | 54 | 07 | 224 | 141 | 63 |
| කැළණිය | 08 | 376 | 330 | 88 | 09 | 500 | 415 | 83 |
| මොරටුව | 12 | 234 | 165 | 71 | 13 | 431 | 192 | 45 |
| රුහුණ | 15 | 727 | 507 | 70 | 05 | 627 | 370 | 59 |
| යාපනය/වව්නියා මණ්ඩපය | 10 | 470 | 401 | 85 | 10 | 572 | 499 | 87 |
| නැගෙනහිර | 08 | 161 | 161 | 100 | 03 | 145 | 145 | 100 |
| රජරට | 06 | 275 | 184 | 67 | 05 | 435 | 145 | 33 |
| සබරගමුව | 10 | 149 | 140 | 94 | 14 | 278 | 224 | 81 |
| අග්නිදිග | 01 | 26 | 10 | 38 | - | - | - | - |
| වයඹ | 14 | 495 | 323 | 65 | 10 | 146 | 88 | 60 |
| සෞන්දර්ය | 05 | 250 | 249 | 100 | 04 | 222 | 79 | 36 |
| ඌව වෙල්ලස්ස | 01 | 25 | 25 | 100 | 04 | 87 | 35 | 40 |
| විවෘත වි.වි. | 02 | 48 | 1 | 2 | 01 | 40 | 40 | 100 |
| ත්‍රිකුණාමලය මණ්ඩපය | 03 | 218 | 199 | 91 | 05 | 227 | 105 | 46 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආ. | 01 | 190 | 190 | 100 | 01 | 535 | 405 | 76 |
| වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 03 | 104 | 23 | 22 | 02 | 100 | 16 | 16 |
| කොළඹ වි. වි. පරිගනක පාසල | 02 | 50 | 50 | 100 | - | - | - | - |
| වි.ප්‍ර. කො.සභාව | 01 | 50 | 50 | 100 | - | - | - | - |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 01 | 40 | 27 | 68 | 01 | 44 | 38 | 87 |
| කොළඹ වි. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා. | - | - | - | - | 01 | 50 | 49 | 97 |
| කාර්ය මණ්ඩල නිල නිවාස ව්‍යාපෘතිය | 01 | 150 | 130 | 87 | 01 | 80 | 80 | 100 |
| තාක්ෂණපීඨ ව්‍යාපෘතිය | 09 | 700 | 700 | 100 | 11 | 3,123 | 2,613 | 84 |
| අයවැය යෝජනා ව්‍යාපෘති | 01 | 150 | 90 | 60 | 04 | 1,730 | 1,014 | 59 |
| එකතුව | 143 | 5,798 | 4,815 | 83 | 133 | 10,946 | 7,996 | 73 |

(මූලාශ්‍ර - ඉදිකිරීම් ව්‍යාපෘති විශ්වවිද්‍යාල වාර්තා 2017.12.31 දිනට හා 2018.12.31 දින

ඉදිකිරීම් ව්‍යාපෘති සංයුතිය - 2018

| | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. | ප්‍රතිපාදන රු.මි. |
|---|---|---|---|
| අවසන් බිල්පත් පියවීමට ඇති ව්‍යාපෘති | 46 | 11,584 | 837 |
| 2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති | 24 | 130,13 | 4,861 |
| 2018 වර්ෂයේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති | 64 | 40,894 | 8,955 |
| 2018 වර්ෂයේ නව ව්‍යාපෘති | 35 | 51,258 | 3,764 |
| එකතුව | 169 | 116,749 | 18,417 |

## 2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති

2018 වර්ෂය අවසන් වන විට පෙර වර්ෂ වල සිට ඉදිකිරීම් කටයුතු ආරම්භව පැවති ව්‍යාපෘති24 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. මෙම වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘතින්හි තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත.

## 01. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා නේවාසිකාගාර 84ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ පවත්නා නේවාසික ගැටලුව කඩිනමින් විසඳීමේ ක්‍රමෝපායක් ලෙස විශ්වවිද්‍යාල පද්ධතිය හා උසස් අධ්‍යාපන ආයතන ආවරණය වන පරිදි නවීන තාක්ෂණයට අනුකූලව නේවාසික ගොඩනැගිලි 84ක් අදියර තුනක් යටතේ කඩිනමින් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය. 2014 වර්ෂයේ ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය යටතේ අදියර I හා අදියර II යටතේ නේවාසිකාගාර 60ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. 2016 වර්ෂයේ අවසන් කාර්තුවේ ආරම්භ වූ අදියර III යටතේ නේවාසිකාගාර 24ක් ඉදිකිරීමට සැලසුම් කෙරිණි. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 5,868ක් වන අතර, අදියර III සඳහා 2018 වර්ෂයේ රුපියල් මිලියන 2,043.6ක් ප්‍රතිපාදන වෙන් කර ඇත. 2018 අවසන් කාර්තුව වන විට එහි මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය 100%ක් වන අතර අදියර III යටතේ 2018 අවුරුද්දේ නේවාසිකාගාර 24 හිම ඉදිකිරීම් කටයුතු අවසන් කර ව්‍යාපෘතිය නිම කර ඇත.

මහල් 4කින් යුත් දළ වශයෙන් වර්ග අඩි 35,350ක් වූ මෙම එක් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් කාමර 100කින් සමන්විත වන අතර එමගින් සිසුන් 400 කට නේවාසික පහසුකම් සැපයීමට හැකිය. ඒ අනුව මෙම නේවාසිකාගාර 84 මගින් එක් වසරකට නේවාසික පහසුකම් සැපයිය හැකි විද්‍යාර්ථීන් සංඛ්‍යාව 33,600කි. 2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ නේවාසිකාගාර කිහිපයක රූප සටහන් පහත දක්වා ඇත.



වන්දාරමුල්ල නේවාසිකාගාරය 5 - නැගෙනහිර විශ්වවිද්‍යාලය




තෙලවල නේවාසිකාගාරය - මොරටුව විශ්වවිද්‍යාලය

| | විශ්වවිද්‍යාලය | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව |
|---|---|---|---|---|---|
| 01 | පේරාදෙණිය | නේවාසිකාගාර -03 | මහඉලුප්පල්ලම-01<br>අපර් හන්තාන -01<br>මහකන්ද-01 | නේවාසිකාගාර -02 | 08 |
| 02 | කොළඹ | වැලිගත්ත-01<br>ශ්‍රී පාලි මණ්ඩපය-01 | - | පිටිපන-02<br>තෙලවල-01 | 05 |
| 03 | ශ්‍රී ජයවර්ධනපුර | නේවාසිකාගාර -02 | - | පිටිපන-02 | 04 |
| 04 | කැලණිය | නේවාසිකාගාර -01 | නේවාසිකාගාර -01 | රාගම -01 | 03 |
| 05 | මොරටුව | නේවාසිකාගාර -01 | නේවාසිකාගාර -02 | - | 03 |
| 06 | රුහුණ | හපුගල - 01<br>කඹුරුපිටිය -01 | එලියකන්ද-01<br>වලව්වත්ත-01<br>හපුගල-01 | තාක්ෂණ පීඨය, කරගොඩ, උයන්ගොඩ-01 | 06 |
| 07 | යාපනය | නේවාසිකාගාර -02<br>වවුනියා මණ්ඩපය-01 | මේන් කැම්පස්-01<br>නිව් ලැන්ඩ්-01<br>කිලිනොච්චි-02<br>වවුනියා මණ්ඩපය-01 | තාක්ෂණපීඨය, කිලිනොච්චි -02 | 10 |
| 08 | නැගෙනහිර | නේවාසිකාගාර-02<br>ත්‍රිකුණාමල මණ්ඩපය-01<br>ස්වාමි විපුලානන්ද -01 | නේවාසිකාගාර -02<br>ත්‍රිකුණාමල මණ්ඩපය-01 | වන්තාරමුල්ල-01<br>තාක්ෂණ පීඨය-01<br>ත්‍රිකුණාමල මණ්ඩපය-01 | 10 |
| 09 | සබරගමුව | නේවාසිකාගාර -02 | සිංහරාජ පරිශ්‍රය-01<br>වලව පරිශ්‍රය-01 | - | 04 |
| 10 | රජරට | නේවාසිකාගාර -03 | සාලියපුර-01<br>පුලියන්කුලම-01<br>මිහින්තලේ-01 | මිහින්තලේ- 02 | 08 |
| 11 | වයඹ | කුලියාපිටිය-02<br>මාකදුර-01 | කුලියාපිටිය- 01<br>මාකදුර-01 | කුලියාපිටිය- 02<br>වෛද්‍ය පීඨය, ලබුයාය- 01 | 08 |
| 12 | අග්නිදිග | නේවාසිකාගාර -02 | ඔලුවිල්-02 | ඔලුවිල්- 02<br>සම්මන්තුරේ- 01 | 07 |
| 13 | විවෘත | නේවාසිකාගාර -01 | - | - | 01 |
| 14 | බෞද්ධ හා පාලි | නේවාසිකාගාර -01 | - | - | 01 |
| 15 | උසස් තාක්ෂණ අධ්‍යාපන ආය. | - | මට්ටක්කුලිය- 01<br>දෙහිවල- 01 | නයිවල- 01 | 03 |
| 16 | සෞන්දර්ය කලා | - | නේවාසිකාගාර - 01 | - | 01 |
| 17 | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | - | නේවාසිකාගාර - 01 | - | 01 |
| 18 | භික්ෂු විශ්වවිද්‍යාලය | - | - | නේවාසිකාගාර -01 | 01 |
| එකතුව | | 30 | 30 | 24 | 84 |

## 02. රුහුණ විශ්වවිද්‍යාලයීය රබීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවණාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 336ක් වන මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 300ක් ඉන්දියන් රජයෙන් ප්‍රදානයක් ලෙස ලැබෙන අතර, උපදේශන ගාස්තු සහ එකතු කළ අගය මත වූ බද්ද සඳහා වන ඉතිරි රු. මිලියන 36.6 රජයේ ඒකාබද්ධ අරමුදලින් යොදවනු ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ මාතර වැල්ලමඩම විශ්වවිද්‍යාලය පරිශ්‍රයේ වර්ග මීටර 350ක භූමි ප්‍රමාණයකින් හා ආසන 1500ක ධාරිතාවකින් යුත් ශ්‍රවණාගාර ගොඩනැගිල්ලක් ඉදි කර ඇත.

2016 වර්ෂයේ මාර්තු මාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ රුපියල් මිලියන 140ක ප්‍රතිපාදන ලබා දී රු. මිලි. 138ක් වියදම් දරා ඇත.2018 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර ඉදිකිරීම් කටයුතු අවසන් කළ මෙම ව්‍යාපෘතියේ ඡායාරූප කිහිපයක් පහත දක්වා ඇත.





## 03. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2014 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 2,500කි. වෛද්‍යවරුන් විශේෂඥ ක්ෂේත්‍ර සඳහා යොමුකිරීම සඳහා වන පාඨමාලා පැවැත්වෙන ශ්‍රී ලංකාවේ එකම අධ්‍යාපන ආයතනය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වේ. එසේම දියුණු රටවල දැකිය හැකි ගුණාත්මක ප්‍රමිතීන් සහිත වෛද්‍ය ක්ෂේත්‍රයන් සමඟ සමගාමී වන නව විශේෂඥ ක්ෂේත්‍රයන් සහ ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, පරමාණුක වෛද්‍ය විද්‍යාව, කළල වෛද්‍ය විද්‍යාව හා ජාන තාක්ෂණය වැනි උපවිශේෂඥ ක්ෂේත්‍ර හඳුන්වා දීමත් අරමුණු අතර වේ.

ඉහතින් දැක්වූ විශේෂඥ ක්ෂේත්‍රයේ ගුණාත්මක පුහුණුවක් ලබාදීම සහතික කිරීම සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූලික යටිතල පහසුකම් සංවර්ධනය කර වැඩිවන දේශීය අධ්‍යාපන අවශ්‍යතාවන්ට ගැළපෙන පාඨමාලා පැවැත්වීම තුළින් විශේෂඥ වෛද්‍යවරුන් බිහිකිරීමටත් මෙම ව්‍යාපෘතිය මගින් හැකිවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම ආයතනයේ වැදගත්කම සලකා නවීන පහසුකම් සහිත පශ්චාත් උපාධි පර්යේෂණ සහ උසස් අධ්‍යාපන කටයුතු සිදු කෙරෙන අධ්‍යාපන ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් වෙන්කර ඇත.





**2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ ව්‍යාපෘති කිහිපයක තොරතුරු පහත දක්වා ඇත.**



විද්‍යා පශ්චාත් උපාධි ආයතන ගොඩනැගිලි සංකීර්ණය - ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.140



දෙමහල් භෝජනාගාර ශාලාවක් හා ද්විතීයික බහුකාර්ය ශිෂ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම - භික්ෂු විශ්වවිද්‍යාලය - ඇ.පි. 213.4



ද්විතීයික පූර්ව වාචික දේශන ශාලාව ඉදිකිරීම - වව්නියා මණ්ඩපය



භූ විද්‍යා පීඨ නව ගොඩනැගිල්ල අදියර II - පේරාදෙණිය විශ්වවිද්‍යාලය - ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.166

### ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති

2018 වර්ෂයට පෙර ආරම්භ කොට ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති ගණන 64කි. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 40,894ක් වන මෙම ව්‍යාපෘති සඳහා 2018 වර්ෂයේ රුපියල් මිලියන 8,955 ප්‍රතිපාදන වෙන් කර ඇත. තුන්වන කාර්තුව වන විට මෙම ප්‍රතිපාදනයේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 6,491කි. තවද මෙම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 14ක භෞතික ප්‍රගතිය 80% ඉක්මවා ඇත.

2018 අධ්‍යයන වර්ෂය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට බඳවා ගන්නා විද්‍යාර්ථීන් සංඛ්‍යාව මූලික වශයෙන් වැඩි කරන ක්ෂේත්‍ර වන වෛද්‍ය, තාක්ෂණ, විද්‍යා හා කළමණාකරණ යන අංශ පාදක කරගෙන ආරම්භ කළ පීඨ මූලික වශයෙන් මෙයට අයත් වේ. එනම් තාක්ෂණ පීඨ ව්‍යාපෘතිය හා වයඹ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය මෙයට උදාහරණ වේ. මීට අමතරව විදේශ ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සඳහා ඉදිවන පර්යේෂණ හා පුහුණු ගොඩනැගිලි සංකීර්ණය යන ව්‍යාපෘති ද ඇතුළත් වේ. ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින ව්‍යාපෘති නාම ලේඛනය ඇමුණුම 2 මගින් දක්වා ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1000 ඉක්මවන ලද ව්‍යාපෘති කිහිපයක තොරතුරු පහත දක්වා ඇත.

### 01. කොළඹ විශ්වවිද්‍යාලයේ පූර්ව ශායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ඉදිවන පූර්ව ශායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ යටතේ අදියර I සහ II ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 6,604ක් වන අදියර IIIහි ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ආරම්භ කළ අතර, 2020 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතය. දේශීය අරමුදල් යටතේ උසස් අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක වන විශාලතම ව්‍යාපෘතිය මෙය වේ. 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 520ක් වෙන් කළ අතර වර්ෂය අවසන් වන විට භෞතික ප්‍රගතිය 18කි.

### 02. තාක්ෂණ පීඨ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

තාක්ෂණ විෂය ධාරාවේ නව පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නව පීඨයන් මෙන්ම පවත්නා පීඨයන්හි නව දෙපාර්තමේන්තු සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2018 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 3123 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම ප්‍රතිපාදන යටතේ ඉදිවන නව පීඨයන්හි තොරතුරු පහත වගුව මඟින් දක්වා ඇත. 2018 වර්ෂය අවසන් වන විට තාක්ෂණ පීඨයන්හි ප්‍රගතිය දැක්වෙන රූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.





**තාක්ෂණ පීඨ ඉදිකිරීමේ ව්‍යාපෘති (2018.12.31 දිනට) රු.මි.**

| විශ්වවිද්‍යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ප්‍රතිපාදන | වියදම |
|---|---|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර | තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ල | 3,073.5 | 1,108.0 | 1,108.0 |
| යාපනය | ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි හා අදාළ ව්‍යුහයන් | 525.0 | 246.0 | 166.0 |
| වව්නියා | ව්‍යවහාරික විද්‍යා පීඨයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය සඳහා ද්වි මහල් ගොඩනැගිල්ල හා අදාළ ව්‍යුහයන් | 200.0 | 154.0 | 133.0 |
| රජරට | තාක්ෂණික අධ්‍යයන අංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණය අදියර i , ii, iii | 156.0 | 156.0 | 75.7 |
| රුහුණු | තාක්ෂණ අධ්‍යයන අංශය, විද්‍යා පීඨය | 691.8 | 140.0 | 140.0 |
| කොළඹ | තාක්ෂණ පීඨයක් ඉදි කිරීම | 2,087.0 | 700.0 | 420.3 |
| වයඹ | ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන හඳුන්වා දීම සඳහා විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම – කුලියාපිටිය | 282.0 | 147.0 | 45.6 |
| වයඹ | කෘෂිකර්ම හා වතු කළමණාකරණ පීඨය අදියර iii | 233.0 | 112.0 | 50.0 |
| ඌව | තාක්ෂණ ධාරාවේ උපාධි වැඩසටහන් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය 2016 (සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම) | 316.0 | 110.0 | 82.2 |
| නැගෙනහිර | ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් සැලසුම් කර ඉදි කිරීම | 208.2 | 125.0 | 115.1 |
| අග්නිදිග | තාක්ෂණ අධ්‍යයන අංශය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම | 450.8 | 125.0 | 100.3 |
| එකතුව | | 8,223.3 | 3,123.0 | 2,436.2 |



ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් සැලසුම් කර ඉදි කිරීම - නැගෙනහිර විශ්වවිද්‍යාලය




ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන හඳුන්වා දීම සඳහා විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම – කුලියාපිටිය -වයඹ විශ්වවිද්‍යාලය



ඉංජිනේරු තාක්ෂණය හා ජෛව පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිලි හා අදාළ ව්‍යුහයන්- යාපනය විශ්වවිද්‍යාලය




කෘෂිකර්ම හා වතු කළමණාකරණ පීඨය අදියර iii - වයඹ විශ්වවිද්‍යාලය


### 03. නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.මෙම ව්‍යාපෘතිය සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) සමඟ 2016.03.24 දින අත්සන් තබන ලද අංක 940 දරන ණය ගිවිසුම මගින් කුවේට් ඩිනාර් මිලියන 10ක් ණය මුදලක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 6,354කි. 2018 වර්ෂයට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 289ක් වෙන් කර ඇති අතර මිලියන 31 ගෙවීම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය නිමකළ පසු වෛද්‍ය උපාධිය සඳහා 100ක් ද, හෙද උපාධිය සඳහා 70ක් ද, ඖෂධවේදී උපාධිය සඳහා 20ක් ද, මහජන සෞඛ්‍ය පිළිබඳ උපාධිය සඳහා 20ක් ද වශයෙන් වාර්ෂිකව මෙම පීඨයට විද්‍යාර්ථීන් ඇතුළත් කර ගැනීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත.

## 04. යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සඳහා පර්යේෂණ හා පුහුණු ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම

උතුරු පළාතේ වියලි කලාපීය කෘෂිකර්මයට අදාළ පර්යේෂණ හා අධ්‍යාපනික ක්‍රියාකාරකම්වල ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ගොඩනැගිලි පහසුකම්, පර්යේෂණ හා පුහුණු ගොවිපොළ, උපකරණ හා යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ මානව ධාරිතාව ගොඩනැංවීමේ මෘදු සංරචකය යනාදිය මෙම ව්‍යාපෘතියට ඇතුළත් ය. ජපන් අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය (JICA) මෙම ව්‍යාපෘතිය සඳහා රු. බිලියන 2.16ක ප්‍රදානයක් ලබා දී ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 2,415ක් වන මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී රුපියල් මිලියන 912ක් වෙන් කර ඇති අතර රු.මිලියන 749 ක් වියදම් කර ඇත. මෙම ව්‍යාපෘතියේ වර්තමාන භෞතික ප්‍රගතිය ඇතුළත් රූප සටහනක් පහත දක්වා ඇත.



ඉදිකිරීමට නියමිත ගොඩනැගිලි සංකීර්ණයේ අනුරුව



## 05. වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - වයඹ විශ්වවිද්‍යාලය (2016 අයවැය යෝජනා)

වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ සිට කිලෝමීටර් 5ක පමණ දුරින් ද, ශික්ෂණ රෝහල ලෙස යොදා ගන්නා කුලියාපිටිය මූලික රෝහලේ සිට කිලෝමීටර් 1.5ක දුරින් ද පිහිටි මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වූ අක්කර 28ක භූමි ප්‍රදේශයක් උපයෝගී කරගනිමින් වෛද්‍ය පීඨය ස්ථාපිත කරන ලදී.

ඉඩම සඳහා වන්දි ගෙවීමට රුපියල් මිලියන 70ක් ද, වෛද්‍ය පීඨ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් 2,341.4ක් ද අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 818ක් ද ලෙස මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 3,229. 4ක් වූ මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2019 වර්ෂයේදී නිම කිරීමට යෝජිතය.

අදියර හතරක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාර හතරක්, මහල් සතරකින් සමන්විත ගොඩනැගිල්ල, පරිපාලන ගොඩනැගිල්ල, කාර්යය මණ්ඩල නිල නිවාස, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, ශ්‍රවණාගාරය, පුස්තකාලය, නේවාසිකාගාරය, ආපනශාලාව, සෞඛ්‍ය මධ්‍යස්ථානය, ව්‍යායාම මධ්‍යස්ථානය, යන ගොඩනැගිලි ඉදිකිරීමට නියමිතය. මෙම වෛද්‍ය පීඨය මගින් වර්ෂයකට සිසුන් 75 දෙනෙකු ඇතුළත් කර ගැනීමට යෝජිත අතර දැනට 10%ක පමණ ප්‍රමාණයකින් ඉදිකිරීම් කටයුතුවල වැඩ නිම

මිලයන 1,200ක් වෙන් කර ඇත. වෛද්‍ය පීඨයේ වර්තමාන ප්‍රගතතිය ඇතුළත් රූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.



පරිපාලන ගොඩනැගිල්ල



පුස්තකාල ගොඩනැගිල්ල

## 2018 වර්ෂයේ ආරම්භ කළ නව ඉදිකිරීම් ව්‍යාපෘති

2018 වර්ෂයේ දී නව ඉදිකිරීම් ව්‍යාපෘති 35ක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘතින්හි ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 51,258කි. මෙම ව්‍යාපෘති 35න් ව්‍යාපෘති 03ක් විදේශීය අරමුදල් යටතේ ද, ව්‍යාපෘති 06ක් අයවැය යෝජනා යටතේ ද වන අතර ඉතිරි ව්‍යාපෘති ඒ ඒ විශ්වවිද්‍යාල මගින් යෝජනා කළ ව්‍යාපෘති වේ. මෙම වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතින්හි තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම් 3 මගින් දක්වා ඇත.

## 01. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

2018 වර්ෂයේ ආරම්භ කළ මහා පරිමාණ ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. `ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 26,400කි. මෙයින් රුපියල් මිලියන 23,200ක් ආසියානු සංවර්ධන බැංකුවෙ ණය ආධාර යටතේ ද, ඉතිරි මුදල් දේශීය අරමුදල් යටතේ ද මූල්‍යයනය කිරීමට සැලසුම් කර ඇත.
මෙම ව්‍යාපෘතිය යටතේ කැලණිය, සබරගමුව , රජරට යන විශ්වවිද්‍යාලයන්හි තාක්ෂණ පීඨ ස්ථාපිත කිරීමටත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීමටත් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් එක් එක් විශ්වවිද්‍යාල සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ , උපකරණ , පොත්පත් හා අවශ්‍ය මෘදුකාංග සහිත අංගසම්පූර්ණ ගොඩනැගිලි සංකීර්ණයක් ස්ථාපිත කෙරේ.

උක්ත විශ්වවිද්‍යාලයන්හි නව පීඨ ආරම්භ කිරීම මගින් විද්‍යාර්ථීන් 850ක් ඇතුළත් කර ගැනීමට යෝජිතය. 2018 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක වේ.

ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ,

- නව්‍ය තාක්ෂණික ඉගෙනුම් සහ පර්යේෂණ පරිසරයක් ඇති කිරීම
- ගුණාත්මක සහ කර්මාන්තයට අදාළ උසස් තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- කර්මාන්ත හා සබඳතා සහ ජාත්‍යන්තර සහයෝගීත්වයන් සවිමත් කිරීම
- පීය කළමනාකරණ ධාරිතාව සවිමත් කිරීම
- නව උසස් අධ්‍යාපන වැඩසටහනක් සැකසීම සඳහා සහාය වීම

### 02. වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය (WUTDP)

වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ (WUTDP) අරමුණ නම් විශ්වවිද්‍යාල ප්‍රජාව සහ අවට ජීවත් වන ප්‍රජාවන් අතර සමීප අන්තර් සබඳතා වැඩි දියුණු කිරීම මඟින් හා රටෙහි උසස් අධ්‍යාපන පද්ධතිය හරහා පිරිනමනු ලබන පහසුකම් තුළින් ග්‍රාමීය-නාගරික සබඳතාව සවිමත් කිරීම මඟින් වයඹ විශ්වවිද්‍යාලය පිහිටි පරිශ්‍රය වටා ඇති විශාල වපරිසරයක් පුරා සුවිශේෂ සංවර්ධන බලපෑමක් ඇති කිරීම ය.
වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය සංරචක හතරකින් සමන්විත වේ:

(1) විශ්වවිද්‍යාල ගොඩනැගිලිවල දළ වශයෙන් වර්ග මීටර් 20,000ක වර්ගඵලයකින් යුත් සිවිල් වැඩ
(2) දැනට ක්‍රියාත්මක උපාධි වැඩසටහන් සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය
(3) ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා
(4) වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අතිරේක වැඩ ලෙස සලකමින්

ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 60 ( සෞදි රියාල් මිලියන 225) වන අතර එයින් ආසන්න වශයෙන් ඇමරිකන් ඩොලර් මිලියන 28ක් (රු.මි. 105ක්) සංවර්ධනය සඳහා වන සෞදි අරාබි පදනම මඟින් මූල්‍යයනය කරනු ඇත.

## 3.1 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති

### 3.1.1 රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2017 අයවැය යෝජනා යටතේ අනුමත වූ රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදීද රු.මිලියන 500 ක මුදලක් වෙන් කර ඇත.වර්ග මීටර් 7,750ක් වූ මෙම ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,179.7 කි. වර්ෂ දෙකකින් සම්පූර්ණ කල යුතු මෙම ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් වටිනාකම වැට් රහිතව රු.මිලියන 850කි. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ඇතුලත් කර ගන්නා වෛද්‍ය සිසුන් සංඛ්‍යාව 160සිට වසරකට සිසුන් 10 බැගින් වසර 4ක් තුලදී සිසුන් 40කින් වැඩි කර වාර්ෂිකව ඇතුලත් කර ගන්නා සිසුන් ගණන 200 ක් කිරීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 257.89 ක් ගෙවීම් කර ඇති අතර Piles ඉදිකිරීමේ වැඩ සිදු කරමින් ඇත.

## 3.1.2 අයවැය යෝජනා අංක 172- සබරගමුව සහ මොරටුව විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ ස්ථාපිත කිරිම

**1.සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීම**

ජීව විද්‍යා විෂය ධාරාව හදාරමින් වාර්ෂිකව 25,000ක පමණ ශිෂ්‍ය සංඛ්‍යාවක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබයි. මෙයින් අති විශාල ප්‍රමාණයක් වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා අවස්ථාවන් අපේක්ෂා කරති. කෙසේ වුවද වාර්ෂිකව රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින පහසුකම් අනුව වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා අවකාශ ඇත්තේ සිසුන් 1,484ක් සඳහා පමණි. මෙම ඉහල ඉල්ලුම සඳහා අවස්ථාවන් ලබා දීමට රජය කටයුතු කරමින් සිටින අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 අයවැය මගින් සබරගමුව සහ මොරටුව විශ්වවිද්‍යාල සඳහා වෛද්‍ය පීඨ ස්ථාපිත කිරීමට යෝජනා විය.

ඒ අනුව 2018 වසරේදී සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කටයුතු ආරම්භ කල අතර 2019 ජනවාරි මාසයේදී සිසුන් 75දෙනෙකුගෙන් සමන්විත ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පලමු සහ තෙවන අදියර දේශීය ප්‍රතිපාදන යටතේ ඉදි කෙරෙන අතර දෙවන අදියර සෞදි සංවර්ධන අරමුදල් යටතේ ක්‍රියාත්මක විමට නියමිතය. එම ව්‍යාපෘතියේ ණය ලබා දීමේ සාකච්ඡා මේ වන විට ක්‍රියාත්මක වේ. පලමු අදියර යටතේ මේ වන විට රු.මි. 76ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත.

**2. මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීම**

අංක අමප/18/2063/824/025 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පැවති ඉඩම් හිඟය නිසා එම පීඨය සඳහා 2018 වර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා යෙදවීමට කටයුතු කරන ලද අතර කුවේට් සංවර්ධන අරමුදල මඟින් ලබා ගන්නා ණය මුදලක් මඟින් මෙම පීඨය ඉදි කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මේ වන විට කටයුතු කරමින් සිටී.

## 3.1.3. අයවැය යෝජනා අංක 175- රුහුණ විශ්වවිද්‍යාලයේ නාවික අධ්‍යයන කේන්ද්‍රයක් ඇති කිරීම

මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 943 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 2018 වසර සඳහා රු.මි.100ක මුදලක් වෙන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා නාවුක ඉංජිනේරු සහ නාවුක ගෘහ නිර්මාණ ශිල්පය යන පාඨමාලා සඳහා පහසුකම් සැපයීම, යාත්‍රා ඉදිකිරීමේ කටයුතු සඳහා පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සැපයීම, එම අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂා කරන අතර විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම සිසුන්100 දෙනෙකුගෙන් පමණ ඉහල යනු ඇතැයි ද අපේක්ෂා කරයි.

### 3.1.4. අයවැය යෝජනා අංක 173- රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ඇති කිරීම

මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 1,300 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 2018 වසර සඳහා රු.මි.200ක මුදලක් වෙන් කරන ලදී. වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ලබා ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම, අධ්‍යන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දිම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්, විද්‍යාගාර සහ භෞතික සම්පත් වර්ධනය කිරීම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂිතය.

### 3.1.5. අයවැය යෝජනා අංක 119- කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය සඳහා ආධාර ලබා දීම

මුළු පිරිවැය රු.මි. 65 ලෙස ඇස්තමේන්තු කර ඇති මෙම ව්‍යාපෘතියට 2018 වසර සඳහා රු.මි.25ක මුදලක් වෙන් කරන ලදී. මේ යටතේ හම්බන්තොට නගරය කේන්ද්‍ර කරගනිමින් කෘෂිකාර්මික නවෝත්පාදන සඳහා පර්යේෂණ සිදු කිරීම, අධ්‍යයන අවස්ථා ලබා දීම සහ ඊට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දිම ආදිය සිදු කෙරේ. 2018 වර්ෂය අවසන් වන විට රු. මි. 18ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇත.

### 3.1.6. දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය ස්ථාපනය කිරීම

2018 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් වූ මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි. 250 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 2018 වසර සඳහා රු.මි.40ක මුදලක් වෙන් කරන ලදී. ආයුර්වේද වෛද්‍ය සේවයේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් හට අවශ්‍ය පර්යේෂණ පහසුකම්, පුහුණු සහ උපදෙස් ලබා දීම ආදිය මෙන්ම සිද්ධ වෛද්‍ය විද්‍යාව සහ යුනානි වෛද්‍ය විද්‍යාව පිලිබඳ විශේෂඥ දැනුමැති ආයුර්වේද වෛද්‍යවරුන් බිහි කිරීමට දායකත්වය සැපයිම මෙම ආයතනයේ පරමාර්ථ අතර වේ. බොරැල්ල ආයුර්වේද රෝහලේ පස්වන මහල දැනට මෙම ආයතනය ස්ථාපිත කිරිම සඳහා තෝරා ගෙන ඇත.

### 3.1.7. උසස් අධ්‍යාපනය සඳහා ස්වාධීන තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීනන යාන්ත්‍රණයක් ඇති කිරීම

උසස් අධ්‍යාපනය සඳහා තිරසාර තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන යාන්ත්‍රණයක් නොමැති වීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනයේ ප්‍රගතියට විශාල බලපෑමක් වී ඇත. මෙම අඩුපාඩුව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධතියේ වර්ධනය සඳහා බොහෝ සෙයින් බලපා ඇති අතර එය ශ්‍රී ලංකාව කලාපීයව හා ජාත්‍යන්තර වශයෙන් උසස් අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රත්‍යක්ෂ නොවීමට ද හේතු වී ඇත. මෙම ගැටලුවට පිළියමක් වශයෙන් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේද දායකත්වය සහිතව උසස් අධ්‍යාපනය සඳහා නව ස්වාධීන තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන අධිකාරියක් ස්ථාපිත කිරිම සඳහා කටයුතු කරමින් සිටින අතර එය 2018 වර්ෂයේ අයවැය යෝජනාවක් ලෙසද ඉදිරිපත් විය.රු.මි.25ක ප්‍රතිපාදන මේ සඳහා වෙන් කරන ලදී.

## 4. විදේශීය ප්‍රදාන යටතේ ප්‍රතිපාදන වෙන්කළ පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 1. වෝසෝ ඒෂියා ව්‍යාපෘතිය

ජල සම්පත් ආශ්‍රිතව 2014 වර්ෂයේ නොරාඩ් ආයතනයේ සම්පූර්ණ ප්‍රදානයක් යටතේ ආරම්භ කල මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘතියෙහි මුළු වටිනාකම රු.මිලියන 78කි. ජල සම්පත් ආශ්‍රිතව සිදුකරනු ලබන පශ්චාත් උපාධි හා පර්යේෂණ කාර්යයන් සවිබල ගැන්වීම සහ ඒ තුළින් දේශගුණික විපර්යාස මෙන්ම ජල අනාරක්ෂිතභාවය හමුවේ සාමාජීය ප්‍රත්‍යාස්ථතාවය වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරයි. 2018 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.මි. 39.22ක ප්‍රදාන මඟින් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ශක්තිමත් කිරීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- තත්ත්ව ශක්‍යතාව සහ ධාරිතාව ජාත්‍යන්තර ප්‍රමිතිය කරා ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් සියලුම හවුල්කාර ආයතනවල දායකත්වයෙන් පශ්චාත් උපාධි වැඩසටහන්වල මොඩියුල සංඛ්‍යාව ප්‍රතිශෝධනය කොට නව පාඨමාලා සංවර්ධනය සිදු කරමින් පවතී.
- නෝර්වේහි පැවති දේශන, කෙටි චාරිකා සහ විද්‍යාගාර ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලාංකික සිසුන් සිව් දෙනෙකු සහභාගී කරවීම.
- සංවර්ධිත රටවල් හා එක්ව තෝරාගත් පාඨමාලා සඳහා "canvas e-learning platform" ක්‍රියාත්මක කිරීම.
- සම්මන්ත්‍රණ, වැඩමුළු, සහ විශේෂ සැසි තුළින් ජල කර්මාන්තයට සම්බන්ධ වෘත්තිකයන් සහ මහජනතාව පුහුණු කිරීම පිණිස ප්‍රචාරණාත්මක වැඩසටහන් පැවැත්වීම.

සිදු කරන ලද ව්‍යවහාරික පර්යේෂණ, හවුල්කරුවන් අතර දැනුම හුවමාරු කර ගැනීම සහ කාර්මික කාර්ය මණ්ඩල වෙනුවෙන් පවත්වන ලද සම්මන්ත්‍රණ සමාජ ප්‍රතිලාභ සඳහා ව්‍යාපෘති නිමැවුම් කෙරෙහි සෘජු දායකත්වයක් දක්වා ඇත. උදා:-

- ➢ අමාත්‍යාංශයේ අදාළ ක්ෂේත්‍රයේ පුද්ගලයෙකුගේ සුපරීක්ෂණය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යකුගේ පර්යේෂණය කොළඹ ජල ගැලීම් පිළිබඳ සිදු කරනු ලැබිය.
- ➢ WS-GIS පිළිබඳ සම්මන්ත්‍රණ, ඉංජිනේරුවන්/ තාක්ෂණික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා වන නවීන නිරූපණ මෙවලම් කාර්මික ධාරිතාව සංවර්ධනය කොට ඇත.

- ව්‍යාපෘති කළමනාකරණ මෙවලමක් ලෙස "Asana (www.asana.com)" හඳුන්වා දෙන ලදී.

### 2. මනා සෞඛ්‍යය හා පෝෂණය තුළින් නව යොවුන් වියේ දරුවන්ගේ හෘද පරිවෘත්තීය අවධානම අවම කිරීම

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් ඔස්ට්‍රියා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වටිනාකම රු. මිලි. 27.9 කි. එම ප්‍රදානවලින් 2018 වර්ෂය සඳහා රු. මිලි. 5ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත. කොළඹ ආශ්‍රිත ප්‍රදේශයේ පවතින සම්පත් පරිස්ථිතිය තුළ පාසල් හරහා ක්‍රියාත්මක

කිරීමට සරල ජීවන ශෛලිය වෙනස් කිරීමේ ක්‍රමෝපායක් සංවර්ධනය කිරීමෙන් නව යොවුන් වියේ දරුවන්ගේ හෘද පරිවෘත්තීය අවධානම අවම කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

**ප්‍රගතිය:**

- මේ වනවිට ව්‍යාපෘතිය සඳහා සියලු විද්‍යාගාර උපකරණ සැපයුම් ලැබී ඇත.
- ක්ෂේත්‍ර වැඩ හා අධ්‍යයනය සඳහා කාර්ය මණ්ඩලය පුහුණුව අවසන් කර ඇති අතර අධ්‍යයනයේ පළමු අදියර සම්පූර්ණ කර ඇත.
- ශක්තිය වැය කිරීම සඳහා ජලය යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනයන් මෙහි විශේෂයෙන්ම ඇතුළත්ව ඇත.
- මූලික රේඛා අවස්ථා විශ්ලේෂණය සම්පූර්ණ කර ඇති අතර භෞතික ක්‍රියාකරකම් සඳහා මැදිහත්වීම සැලසුම් කර ඇත.
- විෂයයන් සඳහා බඳවා ගැනීම සහ ක්ෂේත්‍රයේ මූලික ඇගයීම් සම්පූර්ණ කර ඇත.
- හෘද පරිවෘත්තිය අවදානම ඇගයීම ඇතුළත්ව අදියර 02කින් අධ්‍යයනයන් සිදුකරගෙන යනු ලැබේ.

## 3. උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)

සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය ආවරණය වන පරිදි ලෝක බැංකු ණය යටතේ ක්‍රියාත්මක වන AHEAD ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක ත්‍රිත්වයෙන් පර්යේෂණ සංවර්ධනය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම යටතේ 5. PDO දර්ශකය සහ DLI 6: පර්යේෂණය, සංවර්ධනය, නවෝත්පාදනය, සහ සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල මට්ටමේ පද්ධති (RDIC) සංවර්ධනය කර ප්‍රතිඵල ලබා ගන්නා ලදී.

- නවෝත්පාදනය, වාණිජ්‍යකරණය හා වැඩිදියුණු කිරීම (ICE)/ පර්යේෂණ, වාණිජ්‍යකරණය හා නවෝත්පාදනය (RIC)/ සංවර්ධනය දිශානත පර්යේෂණ (DOR) මාර්ගෝපදේශ සකසා අවසන් කර ඇත.
- විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රතිබද්ධ ඒකකයේ ලකුණු පත්‍රය සකසා නිම කර ඇත. විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රතිබද්ධ ඒකකයන්, විශ්වවිද්‍යාලවල තාක්ෂණ මාරු කාර්යාල වශයෙන් ක්‍රියාකරනු ඇති අතර, පහත දැක්වෙන කටයුතුවලට සහයෝගය දෙනු ඇත.
  - අවශ්‍ය තැන්වලදී ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම
  - තාක්ෂණය සඳහා බලපත්‍ර ලබා ගැනීම
  - වානිජ්‍යකරණය
  - ආයෝජන කළමනාකරණය
- නවෝත්පාදනය, වාණිජ්‍යකරණය හා වැඩිදියුණු කිරීම (ICE)/ පර්යේෂණ, වාණිජ්‍යකරණය හා නවෝත්පාදනය (RIC)/ සංවර්ධනය දිශානත පර්යේෂණ (DOR) මාර්ගෝපදේශ හා විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රතිබද්ධ ඒකකයේ ලකුණු පත්‍ර සඳහා පැහැදිලි කිරීමේ වීඩියෝ පට හා සටහන් සැකසා ඇත.

  - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා මේ සියලු තොරතුරු කරා පිවිසිය හැකිය.

- ➢ විශ්වවිද්‍යාල ව්‍යාපාර ප්‍රතිබද්ධ ඒකකවල අධ්‍යක්ෂවරුන් සමග රැස්වීම 2018 මාර්තු 16 දින පැවැත් විය.
- ➢ නවෝත්පාදනය, වාණිජ්‍යකරණය හා වැඩිදියුණු කිරීම් වැඩසටහනේ සම්බන්ධීකාරකවරුන් සමග රැස්වීම 2018 මාර්තු 21 දින පැවැත් විය.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන හා වාණිජ්‍යකරණ වැඩසටහන යටතේ යෝජනා කැඳවීමේ පළමු වටයේ දී අවම වශයෙන් නවෝත්පාදනය, වාණිජ්‍යකරණය හා වැඩිදියුණු කිරීම (ICE)/ පර්යේෂණ, වාණිජ්‍යකරණය හා නවෝත්පාදනය (RIC)/ සංවර්ධනය දිශානත පර්යේෂණ (DOR) ප්‍රදාන 24ක් ලබා දී ඇත.

## 4. පිරිසිදු බලශක්ති තාක්ෂණයක් සඳහා නිනිති ද්‍රව්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන හා පර්යේෂණ සහයෝගීත්වය (යාපනය විශ්වවිද්‍යාලය)

අධ්‍යාපනයෙහි අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ නෝර්වේජියානු මධ්‍යස්ථානය (SIU) සහ රාජකීය නෝර්වේජියන් තානාපති කාර්යාලය මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘතිය සඳහා රු.මිලි. 52 ක ප්‍රදානයක් ලබා දී ඇත.මෙම වර්ෂයේ දී රු.මිලි. 15 ක මුදලක් ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින්

- XRD, සූර්ය සමාකෘතිය, වායු පිරිසුදු කිරීමේ පද්ධති, විද්‍යාගාර හා කාර්යාල උපකරණ විශ්වවිද්‍යාලයට ලැබී ඇත.
- පර්යේෂණ විද්‍යාගාරය වර්ග අඩි 1500ක බිම් ප්‍රමාණයක් (වර්ග මීටර් 150) දක්වා විස්තාරණය කිරීම.
- පිරිසිදු බලශක්ති යෙදවුම් සඳහා නිනිති ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කටයුතුවලට සිසුන් 05ක් බඳවා ගත් අතර, මාසික යැපුම් දීමනාව ලෙස රු.මිලි. 1.5කට වැඩි මුදලක් ගෙවීම.
- සහයෝගී පර්යේෂණ කාර්යයන් සඳහා කාර්යය මණ්ඩලය හා සිසුන් 10ක් සහභාගි කර ගැනීම.
- 120කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් කොළඹදී පිරිසිදු බලශක්ති තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණය පවත්වන ලදී.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රවීණයන්ගේ සහභාගීත්වයෙන් විශ්වවිද්‍යාලයේ භෞතික හා රසායනික අංශවල ප්‍රජාව සමඟ සාකච්ඡා 06කට වැඩි ප්‍රමාණයක් සංවිධානය කිරීම.


## 5. යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පර්යේෂණ හා පුහුණු සංකීර්ණයක් ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතිය

කාර්යක්ෂම පර්යේෂණ හා අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම මඟින් උතුරු පළාතේ වියළි කලාපීය කෘෂිකර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් ජපන් යෙන් මිලියන 1,667ක (රු. මිලියන 2,100ක පමණ) ප්‍රදානයක් යටතේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී රු.මිලි. 900ක් වෙන්කර රු. මිලියන 836.45ක් ගෙවීම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය මඟින් වියලි කලාපීය කෘෂිකර්මාන්තයේ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සිදු කරයි.

**මෙම ව්‍යාපෘතියේ පර්යේෂණාත්මක ප්‍රගතිය**

## 1. පර්යේෂණ හා පුහුණු ගොඩනැගිලි සංකීර්ණය හා ගොවිපල ගොඩනැගිලි

පර්යේෂණ හා පුහුණු සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා පුහුණු ගොවිපල තුළ පැලැටි ව්‍යාප්ති ඒකකයක්, ආරක්ෂිත කෘෂි අංශයක්, පළතුරු බෝග ජර්ම්-ප්ලාස්ම් (germ-plasm) එකතු කිරීමේ ඒකකයක්, ක්ෂේත්‍ර බෝග පර්යේෂණාත්මක ඒකකයක්, වැව්ලි හා කෘෂි වන විද්‍යා ඒකකයක්, කෘෂි කළමනාකරණ ඒකකයක්, ගෙවතු වගා ඒකකයක්, කෘෂි සංචාරක ඒකකයක් සහ එළුවන් බෝකිරීමේ ඒකකයක් ඉදිකිරීමේ කටයුතු සිදුකරමින් පවතී.



## 2. උපකරණ සැපයීම

කෘෂිකර්ම පීඨයේ දෙපාර්තෙම්න්තු 6 සඳහා පර්යේෂණ උපකරණ, පුහුණු උපකරණ සහ කෘෂි උපකරණ අයිතම 272 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදන කටයුතුවලින් 75%ක් පමණ නිම කර ඇත. උපකරණ විශේෂඥයින් විසින් සමීක්ෂණයක් සිදු කර එම උපකරණ ස්ථාපනය කිරීම සඳහා පවතින ගොඩනැඟිලිවල සුදුසු ස්ථාන හඳුනා ගෙන ඇත.

මීට අමතරව පිරිසැකසුම් උපකරණවල විස්තීර්ණ සැලැස්මක් සකස් කිරීම, පවතින ගොඩනැගිලිවල ස්ථාපනය කරනු ලබන උපකරණවල ස්ථාපන සැලසුම තහවුරු කිරීම, ප්‍රධාන උපකරණවල shop drawing සකස් කිරීම සිදු කර ඇත.

## 3. පර්යේෂණ හා පුහුණු සංකීර්ණය සම්බන්ධ උපකරණ හා අනෙකුත් කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අත්හදා බැලීම් සහ ප්‍රායෝගික පුහුණු ක්‍රම සඳහා සහාය වීමට ටෝකියෝ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන් 2018 වර්ෂයේ මැද භාගයේ කෘෂිකර්ම පීඨයේ දෙපාර්තමේන්තු සියල්ලෙහිම සංචාරය කර ඇත. ඔවුන් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පහත සඳහන් පර්යේෂණ හා අත්හදා බැලීම් කටයුතු සිදු කිරීම සඳහා සහාය වේ.

1. දේශන පැවැත්වීමේ දී අත්හදා බැලීම් සහ ප්‍රායෝගික පුහුණුව ඇතුළත් කිරීම සඳහා සහාය වීම.
2. රසායනාගාර උපකරණ නිසි ලෙස සකස් කිරීම සඳහා ක්‍රමයක් ස්ථාපිත කිරීමට සහාය වීම.
3. පුහුණු හා පර්යේෂණ ගොවිපළ නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා සහාය වීම

## 5.2 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති

2017 සහ 2018 අයවැය යෝජනාවලට අනුව දේශීය ප්‍රතිපාදන යටතේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන පර්යේෂණ ව්‍යාපෘති හතරකි.

### 1 .කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.

2017 වර්ෂයේ අයවැය යෝජනා මඟින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ රු. මිලි. 25ක් මුදලින් ලබා දී ඇත.
2020 වනවිට පරිගණක ක්ෂේත්‍රය මඟින් අපේක්ෂිත ලක්ෂ 2ක් වූ රැකියා අවස්ථා සඳහා ශ්‍රම බලකාය සූදානම් කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය මඟින් අදියර තුනක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.

1. පුහුණු සහ සංවර්ධනය
2. නව පාඨමාලා හඳුන්වා දීම
3. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගීතාව

### පුහුණු හා සංවර්ධනය

මෙම අදියර යටතේ ප්‍රධාන වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කරන ලදී.
විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය විද්‍යුත් අධ්‍යාපනයේ ප්‍රවර්ධනය උදෙසා ද්විමාන හා ත්‍රිමාණ සජීවිකරණය, වීඩියෝ ක්‍රීඩා නිර්මාණය හා සංවර්ධනය පිළිබඳ 2018 ජනවාරි මස 22 දින සිට මාර්තු 02 දින දක්වා එංගලන්තයේ ෂෙෆීල්ඩ් හැලම් විශ්වවිද්‍යාලයේ දී (Shefield Hallam University) පැවැත්වූ වැඩසටහන සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ තුනක් නියෝජනය කරමින් ආචාර්යභවතුන් පස් දෙනෙකු සහභාගී වූ අතර එමඟින් ඔවුන්ට පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා සිද්ධාන්ත හා ප්‍රායෝගික පුහුණුවක් ලැබුණි.

- පරිගණක ත්‍රිමාන සජීව නිර්මාණකරණය හා එහි භාවිතය
- පරිගණක ක්‍රීඩා නිර්මාණකරණය
- චලන චිත්‍රක නිර්මාණකරණය
- පරිගණක ක්‍රීඩා සඳහා වන පරිගණක වැඩසටහන් හඳුනා ගැනීම.
- Motion Capture රූගත කිරීම.
- පරිගණක ආශ්‍රිත ක්‍රීඩා නිර්මාණකරණයේ යෙදී සිටින විද්‍යාර්ථීන් සඳහා වන රැකියා වෙළඳපොළ පිළිබඳව අධ්‍යයනය කිරීම.
- Virtual Reality නිර්මාණකරණය හා එහි භාවිතය

### අධ්‍යාපනය සඳහා මිශ්‍ර /බහුවිධ ඉගෙනුම් ක්‍රම යොදාගැනීම පිළිබඳ වැඩමුළුව

පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ සෑම පීඨයකම "Blended Learning" ඉගැන්වීමේ ක්‍රමවේදය හඳුන්වා දීමේ අරමුණින් පැවති මෙම වැඩමුළුව සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලය සහ අධ්‍යයන කාර්යමණ්ඩලයේ සහායකයින් 70ක් ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ

විධායක නිලධාරීන්, හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් ඇතුළු විවිධ පළාත් නියෝජනය කරමින් පාසල් ගුරුවරුන් 60ක් ද සහභාගී විය.

## 2. අධි තාක්ෂණික ඉලෙක්ට්‍රොනික නිර්මාණ සඳහා පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම

2017 වර්ෂයේ අයවැය යෝජනා යටතේ අනුමත වූ මෙම ව්‍යාපෘතිය මඟින් 2014 වර්ෂයේ සිට මධ්‍යස්ථානයේ ප්‍රගතිය පදනම් කරගෙන, 2018 අයවැය මඟින් මධ්‍යස්ථානයේ කටයුතු තිරසාරව පවත්වා ගැනීමට හා එක්ව සිදු කරගෙන_යාම පිණිස රු.මිලියන 25ක් ලබා දෙන ලදී. මෙම අරමුදල් පහත කාර්යයන් සඳහා යොදාගෙන ඇත.

- මුද්‍රිත පරිපථ පුවරුව (PCB) සඳහා සහ ඩිජිටල් නිර්මාණ සමායනය හා සත්‍යාපනය සඳහා යොදා ගන්නා ඉලෙක්ට්‍රොනික නිර්මාණ ස්වයංකරණ මෙවලම් අලුත් කිරීම .
- ජාලකරණයේ දී සහ විදුලිසංදේශ කටයුතුවල දී අධික වේගවත් ඩිජිටල් සැලසුම් සඳහා සහාය වීමට ඉහළ අන්තයේ FPGA සංවර්ධන පුවරු (high end FPGA development boards) ප්‍රසම්පාදනය
- මුද්‍රිත පරිපථ පුවරු (PCB) සීමිත ප්‍රමාණයක් එකලස් කිරීමට සහාය වීම සඳහා කුඩා PCB එකලස් කිරීමේ යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය. මෙය ආරම්භක සමාගම්වලට කුඩා පරිමාණ නිෂ්පාදනයේ දී පිරිවැය සඵලදායී ක්‍රමයක් සඳහා ඉඩ ප්‍රස්තා සලසනු ඇත.

ප්‍රමිති සහතිකය ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන සංවර්ධන චක්‍රයේ ප්‍රධාන පියවරවලින් එකකි. මධ්‍යස්ථානය මෙම කාර්යය සඳහා සහාය වීමට අඛණ්ඩව උත්සහ කරන ලද නමුත් අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේ දක්වා එය ඉටු කිරීමට නොහැකිව ඇත. දේශීයව නිර්මාණය කරන ලද ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන, විද්‍යුත් ආරක්ෂාව, විද්‍යුත්-චුම්භක අනුකූලතාව හා නිරෝධනයට (EMC/EMI) අදාළව ජාත්‍යන්තර සහතික සමඟ එකඟ වන්නේ දැයි පරීක්ෂා කිරීමට අවශ්‍ය විශේෂිත උපකරණ ප්‍රසම්පාදනය කිරීම ඉහළතම ප්‍රමුඛතාවයි. මෙම සහතික කිරීම් එක්සත් ජනපදය, යුරෝපා සංගමය,සහ ආසියා පැසිපික් වැනි විවිධ භූගෝලීය කලාපයන්හි ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන අළෙවි කිරීමේ දී අත්‍යාවශ්‍ය වේ.

## 3. කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය

### ව්‍යාපෘතියේ අරමුණු

2018 අය වැය යෝජනා යටතේ රු. මිලියන 25 ක් වෙන් වූ මෙම ව්‍යාපෘති මගින් අක්කර 05 වපසරිය තුළ අක්කර අඩි 30 ක ධාරිතාවයක් සහිත ජලාශය ඉදි කිරීම සම්පූර්ණ කර ඇත. භෝග ආකෘති දෙකක් දැනටමත් අවසන් කොට ඇති අතර, අනෙක් භෝග ආකෘති සඳහා ඉඩම් එළිපෙහෙළි කිරීම, පැළ මිලදී ගැනීම සහ වෙනත් කාර්යයන් සිදු කරමින් පවතී. ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා සහ පශු සම්පත් ආකෘතිය ඉදි කිරීම සඳහා අවශ්‍ය කොන්ත්‍රාත් භාරදී ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. වී වගාව සඳහා කුඹුරු (අක්කර 2 1/2) සකස් කිරීම අවසන් කොට ඇති අතර පළමු අස්වැන්න නෙළා ගන්නා ලදී. අස්වැන්න නෙලූ විගස මුං බෝගය වගා කොට එහිද අස්වැන්න නෙලන ලද අතර මහ කන්නයේ වී වගාව සඳහා බිම් පිළියෙල කිරීම ආරම්භ කොට ඇත. වී අස්වැන්න “IARS Rice” ලෙසින් වානිජ වෙළඳපොළ වෙත අලෙවිය සඳහා ද නිකුත් කර ඇත.

අනෙකුත් භෝග ආකෘති ස්ථාපිත කිරීම යටතේ ජලාශයෙන් වාරි ජලය ලබාගෙන කෙසෙල්, ගස්ලබු හා එලවළු වගාවන් කිහිපයක් ද ආරම්භ කර ඇත.

පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස කොළඹ විශ්වවිද්‍යාල කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය 2018 අයවැය යෝජනා ව්‍යාපෘතිය මගින් පහත පරිදි පර්යේෂණ කටයුතු සිදු කර ඇත.

දැනටමත් ස්ථාපිත කර ඇති ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධති ජල කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා සංවේදී (Sensors) භාවිතා කරමින් ශාකයට අවශ්‍ය අවස්ථාවේ පමණක් අවශ්‍ය ජලය ප්‍රමාණයක් ලබාදීමට හැකිවන ලෙස තක්කාලි වගාව සඳහා ස්වයංක්‍රීය ජලසම්පාදන ක්‍රමයක් සඳහා වූ පර්යේෂණය සාර්ථකව නිමකර ඇත.

- කෙසෙල් වගාවේ High density planting systems හා බිංදු ජල සම්පාදනය සමග ශාක වර්ධනය හා අස්වැන්න පිළිබඳව පර්යේෂණයක් ආරම්භ කර ඇත.
- පටක රෝපිත කෙසෙල් පැළ යොදාගෙන ඒවා කේෂත්‍රයේ සිටුවා ඉන් ඇතිවන විකෘතීන් දක්වන පැළ(mutations) තෝරා ගෙන ඒවායින් වියලි කලාපයේ අධික සුළඟින් කෙසෙල් වගාවට සිදුවන හානි අවම කරගැනීම සඳහා බිම් කෙසෙල් පැළ ලබා ගැනීමට ඇති හැකියාව සොයා බැලීමට පර්යේෂණයක් ආරම්භ කර ඇත.